2021

වාර්ෂික වාර්තාව



ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය



ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

වාර්ෂික වාර්තාව
2021

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා
ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

පටුන

සාමාන්‍යාධිකාරීගේ පණිවිඩය 1

1. හැඳින්වීම 1

දැක්ම 1

මෙහෙවර 1

අරමුණු 1

පරමාර්ථ 2

සංස්ථාපිත තොරතුරු 2

අධ්‍යක්ෂ මණ්ඩලය 3

සංස්ථාපිත කළමනාකරණය 4

දිස්ත්‍රික් කාර්යාල ජාලය 5

2. සංස්ථාපිත පාලනය 6

අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම 6

විගණන කළමනාකරණ කමිටුව 6

මාසික ප්‍රගති සමාලෝචනය 6

අභ්‍යන්තර පාලනය 6

විධායක කළමනාකරණය 7

අවදානම් කළමනාකරණය 7

පාරිසරික ගැටළු 9

ආයතනයේ සංවිධාන ව්‍යුහය 10

3. ප්‍රධාන ක්‍රියාකාරකම් 11

4. මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය 14

නිවාස සංවර්ධන කොට්ඨාශය 14

''ඔබට ගෙයක් - රටට හෙටක්'' නිවාස ආධාර වැඩසටහන 14

'ඔබට ගෙයක් - රටට හෙටක්' විසිරි නිවාස ණය වැඩසටහන 15

නව නිවාස ණය වැඩසටහන 15

වැඩි දියුණු නිවාස වැඩ සටහන 16

ඉන්දියානු ආධාර ආදර්ශ ගම්මාන වැඩ සටහන 16

දේපළ කළමනාකරණ කොට්ඨාශය 16

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය 18

නගරමු පුරවර 18

ගම්පෙරළිය (අවිච්ඡේද) 19

පෙර විකුණුම් මහල් නිවාස ව්‍යාපෘති 19

රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ නිවාස ව්‍යාපෘති 20

ප්‍රසම්පාදන කටයුතු 20
සභාධිපත්‍ය දේපළ 20
පොම්පාගාර නඩත්තු කටයුතු 20
විදුලි නඩත්තු කටයුතු 20

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය 21

පාලන අංශය 22
මාණ්ඩලික නිවාස ණය අංශය 24
විනය අංශය 25
ආරක්ෂක අංශය 27
පුස්තකාලය 28

නීති කොට්ඨාශය 29

සින්නක්කර ඔප්පු නිකුත් කිරීම 30
විභාග වෙමින් පවතින නඩුවලට අදාළ තොරතුරු 31
නීති කටයුතු තුළින් අයකරගෙන ඇති මුදල් පිළිබඳ වාර්ෂික ප්‍රගති වාර්තාව 32
දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් පවරා ඇති නඩුවලට අදාළ තොරතුරු 33
උපහාර ණය අයකිරීම සඳහා ගෙන ඇති නීතිමය පියවර 34

සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය 35

ප්‍රගති සමාලෝචනය හා මෙහෙයවීම 35
පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා පිළිතුරු 35
සෙවණ ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය 35
ව්‍යාපෘති යෝජනා 35
1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය 35
ජනතාවගේ තොරතුරු ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීම 36
සංචාරක බංගලා වෙන් කිරීම හා පරිපාලන කටයුතු 36
'ඔබට ගෙයක් - රටට හෙටක්' නිවාස සංවර්ධන වැඩසටහන - 2021.12.31 දිනට කාර්යය සාධනය 36

සැපයුම් අංශය 37
අභ්‍යන්තර විගණක කොට්ඨාශය 38
තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය 39
2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආදායම් සහ ලාභ 40

5. මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය 41

අයකිරීම් ක්‍රියාකාරිත්වය 41

නිවාස ණය - උපහාර ණය හා විසිරි ණය - 2021 41
ග්‍රාමීය කුලී/ නාගරික කුලී/ දේපල ආදායම් - 2021 43

ඕෂන් විව් ඩිවෙලප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්. 44

හැඳින්වීම 44

දැක්ම 44
මෙහෙවර 44
අරමුණු 44
අධ්‍යක්ෂ මණ්ඩලය 44
කාර්ය මණ්ඩලය 45
ආයතනික ප්‍රගතිය 45
කළමණාකාරිත්වයේ ප්‍රගති සමාලෝචනය 45
2022 ඉදිරි සැලසුම් 45

6. මූල්‍යමය ප්‍රකාශන 46
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 46
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය - ඕෂන් විව් ඩිවෙලප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්. 47
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 48
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය - ඕෂන් විව් ඩිවෙලප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්. 49
ගිණුම් ප්‍රතිපත්ති 50
මූල්‍ය ප්‍රකාශනවල සටහන් 60

7. විගණකාධිපති වාර්තාව 84

සාමාන්‍යාධිකාරීගේ පණිවිඩය



ජාතික නිවාස සංවර්ධන අධිකාරී ඉතිහාසයේ පූර්ව වර්ෂයන් හා සසඳා බැලීමේ දී 2021 වර්ෂය ගෝලීය වසංගතයක්ව පැවති කොවිඩ් 19 තත්වය මෙන් ම රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ වුවද උපාය මාර්ගිකව සැලසුම් කල වැඩසටහන් සාර්ථක කර ගත් වඩාත් අභියෝගාත්මක වර්ෂයක් ලෙස සනිටුහන් කිරීමට හැකිවීම් පිළිබඳව නිහතමානීව සතුටු වෙමි.

නිවාසකරණය

නිවාසකරණයේ ප්‍රධානතම රාජ්‍ය ආයතනය වශයෙන් කටයුතු කරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ලාංකික ජන සමාජයේ සෑම පුරවැසියෙකුටම ස්ථීර නිවහනක ජීවත්වීමේ උදාර අරමුණ තහවුරු කිරීම උදෙසා 2020 වර්ෂයේ සිට ක්‍රියාවට නැංවූ "ඔබට ගෙයක් - රටට හෙටක්" වැඩසටහනේ තවත් ඉදිරි පියවරක් තබමින් 2021 වර්ෂයේ දී සහභාගීත්ව ක්‍රමවේදය අනුගමනය කරමින් දුගී දුප්පත් හා අඩු ආදායම්ලාභී පවුල් ඒකක 29,646 ක් සඳහා ප්‍රතිලාභ සැලසීමට සෘජුවම දායකත්වය ලබාදුනි. එහිදී විශේෂයෙන් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් නගා සිටුවීමේ අරමුණින් පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ඇතිව ක්‍රියාවට නංවන ලද ආධාර වැඩසටහන තුලින් පවුල් ඒකක 12,989 කට නව නිවාස ඉදි කිරීම සඳහා දායක විය.

සමාලෝචිත වර්ෂය තුළ නිවාසකරණය සඳහා ජාතික නිවස සංවර්ධන අධිකාරිය මගින් සෘජුවම ආයෝජනය කළ මුදල රුපියල් මිලියන 8,780.443 ක් වන අතර ඒ හරහා රටේ ආර්ථිකයට කරණු ලැබූ දායකත්වය රුපියල් මිලියන 31,476 ක් පමණ විය.

එසේම මධ්‍යම පාන්තික ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපාදන යොදා නොගනිමින් පෙර විකුණුම් පදනම මත සෘජු ඉදි කිරීම් ක්‍රමවේදය අනුගමනය කරමින් නිවාස ව්‍යාපෘති 4ක් ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර ඒ යටතේ නිවාස ඒකක 135 ක ඉදිකිරීම් කටයුතු නිමවෙමින් පවතී.

ජාතික නිවස සංවර්ධන අධිකාරියට අයත් දේපළ වල පදිංචිකරුවන්ගේ අයිතිය තහවුරු කර අභිමානවත් පුද්ගලයෙකු ලෙස සමාජයේ ජීවත්වීම තහවුරු කරමින් සමාලෝචිත වර්ෂය තුළ සින්නක්කර ඔප්පු 947ක් ප්‍රදානය කිරීමටද හැකි විය.

මූල්‍ය තත්වය

සමාලෝචිත වර්ෂය තුල ණය ආපසු අයකිරීම් ඇතුළු දේපළ ආශ්‍රිත ආදායම් වලින් රුපියල් මිලියන 2,558.0 ක් ආපසු අයකර ගැනීමට හැකිවිය. 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී ප්‍රාග්ධන සංචිත රුපියල් මිලියන 259 කින් ඉහලයාම සිදුවිය. දිගු කාලීන ණයවල පහලයාම රුපියල් බිලියන 1.450 ක් වූ අතර ජංගම බැරකම් අඩුවීම රුපියල් මිලියන 130.0 කි. 2019 වර්ෂයට සාපේක්ෂව ආයතන හා පරිපාලන වියදම් රුපියල් මිලියන 229.0 කින් අවම කිරීම තුලින් ආයතනයේ ශුද්ධ අලාභය රු.මි. 185.0 කින් අඩුකර ගැනීමට හැකිවී ඇත. අභියෝගාත්මක වර්ෂයක් වුවද 2021 රාජ්‍ය අයවැය මගින් ලබාදෙන ලද මුදල් අග්‍රිමය 100%ක්ම සැලසුම්කල වැඩසටහන් සඳහා යෙදවීමට හැකිවීම කාර්යක්ෂම හා ඵලදායි කළමණාකරණයේ ප්‍රතිඵලයකි.

මෙහෙයුම් ප්‍රතිඵල

1560 කින් යුත් ස්ථීර කාර්ය මණ්ඩලයක් හා 282කින් යුත් කොන්ත්‍රත් හා වෙනත් කාර්ය මණ්ඩලයක්ද සමඟින් ආයතනයේ කටයුතු 2021 වර්ෂයේ දී සාර්ථකව මෙහෙයවීමට හැකිවිය.

ගෝලීය වසංගත තත්වය මෙන්ම ආර්ථික හා පෞද්ගලික අභියෝග විසින් පණවන ලද ඉතා දුෂ්කර තත්වයන් හමුවේ නොසැලී ඒ කිසිවක් තමන්ගේ කාර්යය සාධනයට හෝ කාර්යයයේ ගුණාත්මකභාවය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇතිකර නොගෙන කැපවීමෙන් කටයුතු කල සමස්ථ කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පලකිරීමට ද මෙය අවස්ථාවක් කර ගන්නා අතර, ඉදිරි 2022 වර්ෂයේද ආයතනයේ සමස්ථ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කාර්යය මණ්ඩලයේ කැපවීම අපේක්ෂා කරමි.

ඉංජි. කේ. ඒ. ජානක
වැ.බ. සාමාන්‍යාධිකාරී

1. හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කරගෙනයාම සඳහා ස්ථාපිත කර ඇති මෙම අදිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ උප කාර්යාල 09 ක් මගින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලබයි.

දැක්ම

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුවපහසු නිවසක් හිමිකර දීම.

මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවගේ විශේෂයෙන්ම නිවසක් සතුකර ගැනීමට මාර්ගයක් නොමැති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ජාතික වශයෙන් උනන්දු කරවීම, පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම මෙන්ම නිවසක් නොමැති මධ්‍යම පාන්තික පවුල් සඳහා සහන මිලට නිවසක් ඉදිකර ලබාදීම සඳහා අවශ්‍ය මැදිහත්වීම. එමගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම හා ආර්ථික සමෘද්ධිය ළඟාකරදීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරයි.

අරමුණු

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත අනුව අපගේ අරමුණු වන්නේ ....

- මහල් නිවාස හා වෙනත් වාසස්ථාන හෝ ගොඩනැගිලි ඉදිකිරිමෙහිලා කෙළින්ම නියුක්තවීම.
- නිවාස හිගය අඩු කිරිම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට සැලසුම් සකස් කිරීම.
- මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශවලින් එම මුඩුක්කු සහ පැල්පත් ඉවත්කිරිම සහ ඒ ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනයට රුකුල්දීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනය සඳහා යම් තැනත්තකුට ඉඩම් ලබාදීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවකට සමානවන යම් ක්‍රියාකාරකමක නියුක්ත තැනත්තන්ට මුදල් හෝ වෙනත් පහසුකම් සැපයීම.
- නිවාස සංවර්ධනයෙහි සියළු අංශවලට අදාළවන ක්‍රියාකාරකම්වල නිරතවීම, ඒවාට අනුබලදීම සහ ඒ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
- ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියළුම ක්‍රියාකාරකම්වල යෙදීම.

පරමාර්ථ

- අඩු ආදායම්ලාභී පවුල් වලට නිවාස ඉදිකර ගැනීම සඳහා පහසුකම් සැලසීම.
- අන්ත දුගී පවුල් වලට නිවාස ඉදිකරගැනීම සඳහා සහාය ලබාදීම.
- මුඩුක්කු සහ පැල්පත්වාසීන්ට නිවාස පහසුකම් සැලසීම සඳහා ඍජුව සම්බන්ධවීම හා සම්බන්ධීකරණය කිරීම.
- මධ්‍යම ආදායම් ඇති පවුල් සඳහා දූරිය හැකි මිලකට නිවාස ඉදිකිරීම පිණිස අදාළ ඉදිකිරීමේ කටයුතු සිදුකරන්නන්හට පහසුකම් සැපයීම.
- නිවාස ඉදිකිරීමේ අරමුණු සඳහා ඉඩම් කැබලි ඍජුව ලබාදීම හෝ පහසුකම් සැලසීම.
- නිවසක ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම.
- පැරණි නිවාස සංකීර්ණයන්වල ජීවත් වන පවුල් සඳහා එම නිවාස සංකීර්ණ ප්‍රතිසංස්කරණය කිරීම මගින් සුදුසු ප්‍රසන්න පරිසරයක් සහිත නිවාස ක්‍රම බවට පත් කිරීම.
- නාගරික අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස සපයාදීම.
- කාර්යක්ෂම ගුණාත්මක සහ ස්ථිරසාර සේවාවක් සැපයීම.

සංස්ථාපිත තොරතුරු

නම	:	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
නීතිමය භාවය	:	1979 අංක 79 දරණ පනත
සංස්ථාපිත වර්ෂය	:	1979
ලියාපදිංචි කාර්යාලය	:	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මහලේකම් කාර්යාලය, අංක 34 , සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථන අංකය	:	2421606 , 2431707 , 2430410 , 2431722, 2421748 , 2380874
ෆැක්ස්	:	2434892
විද්‍යුත්තැපෑල	:	chairman@nhda.lk
වෙබ් අඩවිය	:	www.nhda.lk
විගණකවරු	:	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව
උපදේශන නීතිඥවරු	:	නීතිපති නීතිපති දෙපාර්තමේන්තුව, හල්ස්ඩෝෆ් , කොළඹ 12.
බැංකුකරුවෝ	:	ලංකා බැංකුව , ආයතනික ශාඛාව , ඇව්ලන් චතුරශ්‍රය , කොළඹ 01.
	:	මහජන බැංකුව , මූලස්ථාන ශාඛාව, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපති

ආර්. දුමින්ද සිල්වා මහතා

අංක 40/8, පෙරේරා ලේන්, පැලවත්ත , බත්තරමුල්ල

(2021.08.10 - 2021.12.31)



සභාපති

රේණුක දුෂ්‍යන්ත පෙරේරා මහතා

අංක 365, නාගහවත්ත පාර, කොටිකාවත්ත , මුල්ලේරියාව.

(2020.01.01 - 2021.04.19)

සභාපති (වැ.බ.)

ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, කොළඹ 02

(2021.05.06 - 2021.08.09)

උප සභාපති

නීතිඥ ඩී. එම්. අරුණ කීර්ති දසනායක මහතා

අංක 79/14 , කොළඹ පාර , කුරුණෑගල.

(2020.01.02 - 2022.06.16)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

කේ.කේ. ගවේෂ සනිරත්න මහතා

සමනළ, කටුලන්ද, දෙකටන

(2021.01.29 - 2022.12.31)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඉංජි. විමලසිරි වන්නිආරච්චි මහතා

අංක 158/120, මඩවල, මිනුවන්ගොඩ

(2020.01.02 - 2022.12.31)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

සුදත් අබේවර්ධන මහතා

අංක බී-5/1/4 ,
හිඹුටු උයන නිවාස සංකීර්ණය,
මුල්ලේරියාව නව නගරය , මුල්ලේරියාව
(2020.01.02 - 2022.06.16)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඩී. එම්. එස්. මදාරා ද සිල්වා මහත්මිය

සහකාර අධ්‍යක්ෂක,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
(මුදල්) කාමර අංක 310, 3 වන මහල,
කොළඹ 01.

(2020.01.13 - 2022.11.29)

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

නීතිඥ මනෝරි ටී. ඔලබොඩුව මිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
කොළඹ 02

සංස්ථාපිත කළමනාකරණය



පී. එ ම්. එල්. පී. එදිරිසිංහ මහතා
සාමාන්‍යාධිකාරී (වැ.බ.)
(2021.01.01 - 2021.05.12)



ඉංජි. කේ. ඒ. ජානක
සාමාන්‍යාධිකාරී (වැ.බ.)
(2021.05.13 - 2021.12.31)

පී. ටී. එස්. ප්‍රියදර්ශණී මහත්මිය
නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (මුදල්) - වැ.බ.

පී. එම්. එල්. පී. එදිරිසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් කළමනාකරණ හා පාලන)

ආර්. පී. කේ. පල්ලේවෙල මහතා
නියෝජ්‍ය සමාන්‍යාධිකාරී
(සැලසුම් හා ප්‍රගති) - වැ.බ.


පී. ඒ. එස්. පී. ආරියවංශ මහතා
නියෝජ්‍ය සමාන්‍යාධිකාරී
(නිවාස සංවර්ධන)

කේ. එච්. සී. ජයලත් මහත්මිය
නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (නීති) - වැ.බ.

එච්. එච්. ලීලානන්ද මහතා
නියෝජ්‍ය සමාන්‍යාධිකාරී
(දේපල කළමනාකරණ හා අලෙවි)

එම්. එන්. එස්. මහානාම මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

දිස්ත්‍රික් කාර්යාල ජාලය



2. සංස්ථාපිත පාලනය

ආයතනික පාලනයේ උසස් මට්ටම් දක්වා ගමන් කිරීම සඳහා දැඩි නොනවතින කැපවීමක් අප සතුව ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනයේ ප්‍රමිතීන් මෙන්ම රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ආදි ආයතන අමාත්‍යාංශ මගින් යෝජනා කරන ලද සුදුසුම කටයුතු අනුගමනය කිරීමට සැමවිටම උත්සාහ කරන අතර, ගරු අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන තීරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා වර්තමානයේදී රාජ්‍ය අමාත්‍යාංශය මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම.

අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම

අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මාසයකම රැස්වෙන අතර අවශ්‍යතාවය අනුව මසකට රැස්වීම් කිහිපයක් වුවද පැවැත්වීමට සිදුවේ. අයවැයට සාපේක්ෂකව ප්‍රගතිය සෑම මසකම එමගින් සමාලෝචනය කරයි. විචලනයන් හඳුනාගෙන ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා සුදුසු ප්‍රතිකර්ම යොදයි. 2021 වසර තුල රැස්වීම් වාර 22 ක් පවත්වන ලදි.

විගණන කළමනාකරණ කමිටුව

සාමාන්‍යාධිකාරිවරයා සහ අධ්‍යක්ෂවරු 03 දෙනකුගෙන් සමන්විත විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමට අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හා රජයේ විගණක අධිකාරි සමගින් ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහභාගී වේ.

විගණන හා කළමනාකරණ කමිටු මගින් ගිණුම් හා මුල්‍ය කළමනාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කෙරෙන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාල නීති රීති අනුව අභ්‍යන්තර පාලනයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ. 2021 වසර තුල විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වාර 06 ක් පවත්වා ඇත.

විගණන හා කළමනාකරණ කමිටු විසින් ගිණුම් හා මුල්‍ය කළමනාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කරන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාළ නීති රීති අනුව අභ්‍යන්තර පාලනය, ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ.

2020 වර්ෂයේ පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් හා බාහිර නිළධාරීන් එනම් මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩළ සාමාජික, රජයේ විගණක, ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උප සභාපතිතුමා හා සෙසු අධ්‍යක්ෂ මණ්ඩළ සාමාජිකයින් හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් කළමනාකරණ කමිටු සාමාජිකයින් ලෙස සහභාගී වී ඇත.

මාසික ප්‍රගති සමාලෝචනය

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්, සභාපති, උප සභාපති, අධ්‍යක්ෂ මණ්ඩළය, සාමාන්‍යාධිකාරි හා සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් , දිස්ත්‍රික් කළමනාකරුවන් , අමාත්‍යාංශයට සම්බන්ධිත ආයතන වල ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සතිපතා හා මාසිකව ආයතනයේ කටයුතු පිළිබඳව ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබීය.

අභ්‍යන්තර පාලනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම ආයතනයේ වත්කම් වල සුරක්ෂිතභාවය සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ උපදේශනයන් ක්‍රියාත්මක කර ඇත. නියෝජ්‍ය සමාන්‍යාධිකාරි කොට්ඨාශ අනුව එම කොට්ඨාශයන්හි අංශ අනුව ධුරාවලියවකට වගකීම් ඉහළ සිට පහලට බෙදා හැර ඇත. එසේම එක් අයෙකුගේ රාජකාරිය තවත් අයෙකුගේ රාජකාරිය තුලින් ස්වයංක්‍රීයව පරීක්ෂාවකට භාජනය වන පරිදි රාජකාරි බෙදා හැර තිබේ.

ඒ හා සමානව අධ්‍යක්ෂ මණ්ඩලය මනාව සැකසුනු මාසික වාර්තා කරන ක්‍රමයක් තුලින් අභ්‍යන්තර පාලනය සහතික කරන අතර, වත්කම් හා බැරකම් අතර සමබරතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගනු ලැබේ.

සතිපතා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන අතර, සියළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කොට්ඨාශවල කටයුතු පිළිබඳ සාකච්ඡා කරනු ලබයි. මිල කමිටු, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු , දේපල අනු කමිටු හා අභියාචනා කමිටු, විනය කමිටු පත් කිරීම සඳහා ද පියවර ගෙන ඇත. අවශ්‍යතාවය පරිදි එම කමිටුවලද රැස්වීම් පවත්වා තීරණ ගනු ලැබේ.

විධායක කළමනාකරණය

- ප්‍රධාන කාර්යාලයේ සෑම අංශයකම ප්‍රධානත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු හෝ සහකාර සාමාන්‍යාධිකාරිවරයෙකු දරණ අතර, දිස්ත්‍රික් කාර්යාල 25 ක් සමග කලාප හා උප කාර්යාල 09 ක වගකීම ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු/ දිස්ත්‍රික් කළමනාකරු හා කළමනාකරු සතු වේ.

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් සහ ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු/ දිස්ත්‍රික් කළමනාකරුවන් සාමාන්‍යාධිකාරී වෙත රාජකාරී වාර්තා කල යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරී විසින් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ රාජකාරී වාර්තා කිරීම හා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කල යුතුය.

අවදානම් කළමනාකරණය

විශාල සේවාදායකයන් සමුහයකට සියලුම පහසුකම් සහිත නිවාස පහසුකම් සපයන සහ දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රාදේශීය කාර්යාල 25 කින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එහි විවිධ හවුල් කරුවන්ගේ අවශ්‍යතා රැක ගැනීම සඳහා මූල්‍යමය සහ මූල්‍යමය නොවන අවධානම් රාශියකට මුහුණු දීමට සිදුවන අතර, එය පූර්ව කළමනාකරණය කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම අරමුණු ළඟාකර ගැනීමට, එහි සංස්ථාපිත කළමනාකාරිත්වයේ උපදෙස් මත ප්‍රතිපත්තීන්, ක්‍රියාමාර්ග සහ අවධානම් කළමනාකරණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහයන් ගොඩනැගීම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරයි. එමගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම ව්‍යාපාරික මෙන්ම ජනතාවට සේවා සපයන ආයතනයක් ලෙස අරමුණු ලගාකර ගැනීම සිදු කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආපදාවට ලක්වීම කෙරෙහි බලපාන ක්‍රියාදාමයන් හා පාලනය කළහැකි පද්ධතීන් වල දුර්වලතා හඳුනාගැනීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාදාමය අධිකාරියේ විගණන අංශය සමග සම්බන්ධ වී කටයුතු කරයි. කාර්යක්ෂමතාවය සහ පාලනමය තත්වයේ ප්‍රමාණත්මතාවය පිළිබඳව ස්වාධීන අදහස් කාලානුරූපීව කළමනාකරණය වෙත පළකිරීම විගණන අංශය මගින් සිදුකරනු ලබයි.

දුවශීලි අවදානම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගිවිසුම් සඳහා වූ බැඳීම් නියමිත කාලය තුළ දී ඉටුකිරීමට නොහැකිවූවිට මෙම අවධානමට ගොදුරුවේ. ඒවායේ කාලය ඉකුත් අවස්ථාවලදි මූල්‍යමය වගකීම් ඉෂ්ඨ කිරීම සඳහා අරමුදල් තිබීම සහ අවශ්‍යතා පැන නැගුණ අවස්ථාවලදි ඒවායෙහි ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන තිබෙන බව තහවුරු කිරීම මෙහි ඇතුලත් වේ.

සැලසුම්කරණය සඳහා මගපෙන්වීම, ක්‍රමවත් අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම, ගිවිසුම් බැඳීම් සහ වර්ධන අපේක්ෂාවන් සඳහා මුහුණ දීමට අවශ්‍ය ප්‍රමාණවත් ද්‍රවශීලි බවක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වන බව තහවුරු කිරීම ආදි ප්‍රධාන කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට සහ සංස්ථාපිත කළමනාකරණයේ සාමාජිකයින් වෙත කළමනාකරණය සඳහා පවරා දී ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය එය සතු ප්‍රධාන අරමුණු ලඟාකර ගැනීම සඳහා,

- රාජ්‍ය ප්‍රතිපත්ති හා ආයතනික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී සමබරතාවයකින් ද්‍රවශීලතාවයට බාධාවක් නොවන අයුරින් ක්‍රියාත්මක කිරීම.
- මුදල් ඉපයීම සම්බන්ධ විකල්ප මාර්ග ප්‍රමාණවත් ලෙස තහවුරු කිරීම.
- පවත්නා ණය ආයෝජන සහ මුදල් ඉපයීමේ ක්‍රියාමාර්ග කාලානුරූපීව නැවත සලකා බැලීම.
- පවතින මිල ගණන් සමාලෝචනයට ලක් කරන අතරම, තරඟකරුවන්ගේ මිල ගණන් විශ්ලේෂනයක් සිදු කිරීම.
- සංස්ථාපිත නිර්ණායකයන්ට අනුකූලව ද්‍රවශීලි අනුපාත සඳහා මග පෙන්වීම.
- ප්‍රදානයන්, අභ්‍යන්තර උපයන අරමුදල් හා මුදල් බවට පත්කළ හැකි කෙටිකාලීන ආයෝජන පාලනය කිරීම තුළින් ද්‍රවශීලිතාවය පවත්වාගෙන යාම දෛනිකව කරනු ලැබේ.

වෙළඳපොල අවදානම

මිල සංවේදී වත්කම් හා බැරකම් පවත්වාගෙන යෑමේ දී පැනනගින පාඩු හා සම්බන්ධව මෙම අවදානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාතයන්ගේ වෙනස්වීම සහ කාලයත් සමග ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල දෝලනය වීම, පුහුණු ශ්‍රමික ගාස්තු ඉහළ යාම හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත මෙය බලපානු ලැබේ. විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මෙම තත්වය තදින් බලපානු ලබයි.

වෙළඳ පොලේ නිවාස සඳහා පවතින අධික ඉල්ලුම හේතුවෙන් නිවාසයන්හි මිල ඉහලයාමේ අවදානම පාලනය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන වල මැදිහත්වීම අවශ්‍යවේ.

රුපියල අවප්‍රමාණය වීමත් සමග ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ඉහල යාම විශේෂයෙන් වහල සෙවිලි ද්‍රව්‍ය, ටයිල් වර්ග හා නාන කාමර අයිතම වල සිදුව ඇති අධික මිල ඉහල යාමේ අවදානම හා ශ්‍රමය සඳහා වන වියදම් වල ඉහල යාම වෙළඳ පොල මිල ගණන් වලට නිවසක් අවශ්‍ය සෑම පුද්ගලයෙකුටම නිවසක් සතු කිරීමට රජය මගින් ලබා දෙන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙළඳ පොල අවදානමට මුහුණදීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සිදුවේ.

සංස්ථාපිත කළමනාකරණ අරමුණු ලඟාකර ගැනීමට දායකව කටයුතු කරන අනෙකුත් ප්‍රධාන හවුල්කාර ආයතනයන්ගේ අවශ්‍යතාවයන් සහ සේවාදායකයන්ගේ මුදලට සරිලන සේවාවක් සඳහා වටිනාකමක් සපයා දෙමින් නිවාස වෙළඳ පොලට එල්ල වී ඇති තර්ජනයන් උපරිමයෙන් පාලනය කරගැනීම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

මෙහෙයුම් අවදානම

භාහිර තරඟකාරී බලවේගයන්ට මුහුණදීමට අපහසු හෝ ක්‍රියාකාරකම්වලට බාධාවන් පමුණුවන අභ්‍යන්තර දුර්වලතා නිසා ප්‍රමාණවත් නොවන හෝ අභ්‍යන්තර ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම අවදානම් ඇතිවේ.

සංවිධානය තුල යහපත් සහ මනා ලෙස පාලනය කරන ලද ක්‍රියාකාරී පරිසරයක් ලබාදීම සඳහා සැකසුණු ව්‍යුහයන්ගෙන් සහ පුළුල් ප්‍රතිපත්තීන් සහිත පද්ධතියකින් සැකසුන කාලීනව සිදුවන අවධානම් පාලනය කරමින් පවත්වාගෙන යන ආයතනයක් ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වේ.

උද්ධමනය ඉහල යාමත් සමග පාරිභෝජන වියදම් ඉහලයාම හේතුවෙන් පුද්ගල ඉතිරිකිරීම් පහල යාම හේතුවෙන් ණය ආපසු ගෙවීම අඩුවීමත් ඒ තුලින් සංවර්ධන වැඩසටහන් වලට කරන අහිතකර බලපෑම් හා නිවාස ඉදිකිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභී දායකත්වය නොලැබීමේ අවධානම.

කොවිඩ් වසංගතය වැනි විශේෂ ලෙඩ රෝග හා උවදුරු වලින් ඇතිවිය හැකි අවදානම් ගැන සැලකිල්ලට ගැනීම. එසේම රට තුල හෝ ගෝලීය වශයෙන් ඇතිවිය හැකි මූල්‍ය හා / හෝ ආර්ථික අර්බුද හමුවේ ආයතනය එකී කටයුතු පවත්වාගෙන යාමේදී මුහුණ දෙන අවදානම

ඵලදායී ක්‍රියාකාරී අවධානම් කළමනාකරණය සඳහා විශේෂ පියවර කීපයක් ගෙන ඇත.

- තොරතුරුවල සුරක්ෂිතභාවය ආරක්ෂා කරමින් සියළුම දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් කාලානුරූප දත්ත විශ්ලේෂණය හා වාර්තාකරණය
- තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තීන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- නිවාස වැඩසටහන් නිරතුරුවම සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.
- ණය නැවත අයකිරීමේ වැඩ සටහන් වල ක්‍රියාකාරීත්වය
- ආයතනියක මූල්‍ය දායකත්වය සහිතව ක්‍රියාත්මක නිවාස වැඩසටහන් වල උපරිම ඵලදායිකත්වය හා කාර්යක්ෂමතාවය ලබාගැනීමට වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

මෙහෙයුම් අවධානම් පාලනය කිරීම මධ්‍යම කළමනාකරණයේ ප්‍රධානම වගකීම වේ. පාලිත පරිසරයන්හි අනන්‍යභාවය පවත්වා ගැනීම සඳහා මුදල්, විගණන හා අනෙකුත් සහායක සේවා අංශ මගින් මහගු කාර්යයක් ඉටු කරයි.

වටිනා දේපල ප්‍රමාණයනක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව ඇති හෙයින් යෝග්‍ය උපක්‍රම භාවිතා කිරීම සහ නිරන්තර සමාලෝචනය සහ කාර්යය මණ්ඩලයේ කැපවීම මගින් තරඟකාරී පරිසරයතුල ආයතනයේ සාර්ථකත්වය සඳහා ආයතනික අරමුණු වලට අනුව එම දේපළ ඵලදායිව හා කාර්යක්ෂමව යොදා ගත හැකිය.

පාරිසරික ගැටළු


මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති, අනෙකුත් නිවාස ව්‍යාපෘති ඉදිකිරීමට ප්‍රථම රාජ්‍ය ආයතන, මධ්‍යම පරිසර අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ අදාළ පළාත් පාලන ආයතන වැඩ නිර්දේශ වලට අනුව පරිසර සංවර්ධන වැඩ පිලිවෙල ක්‍රියාත්මක කරමින් පරිසරයට අවම හානියක් වන ආකාරයට හා පරිසරයට ගැලපෙන ව්‍යෘපෘති ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනතාවට සුරක්ෂිත හා යහපත් පරිසරයක් සපයා දෙනු ලැබේ. ඒ අතරම පානීය ජලය, ප්‍රමාණවත් පිවිසුම් මාර්ග, අඛණ්ඩ විදුලි සැපයුම, වැසි ජලය අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධති, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් වැනි යටිතල පහසුකම් ද සපයනු ලැබේ.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නීති රීති මගින් සභාධිපත්‍ය දේපලවල පදිංචිකරුවන්ට වඩා යහපත් පරිසරයක් සහතික කිරීම.

නිවාස වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී පාරිසරික සංවේදී කලාපවල හා ස්වභාවික විපත් විශේෂයෙන් නාය යාමේ අවධානම සහිත ප්‍රදේශ, ගංවතුරෙන් හා සුනාමි අවධානම් ඇති ප්‍රදේශ මෙන්ම උග්‍ර ජල හිඟ ඇති කඳුකර ප්‍රදේශවල නිවාස ඉදිකිරීමේදී ඇති අවධානම.

ආයතනයේ සංවිධාන ව්‍යුහය


සභාපති සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරීගේ අධ්‍යක්ෂක මණ්ඩලය
HM 2-3
කළමනාකාර්
HM 1-3
මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන කොට්ඨාසය
මූල්‍ය කොට්ඨාසය
නිවාස කළමනාකරණ කොට්ඨාසය
ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාසය
දේපල කළමනාකරණ කොට්ඨාසය
සැලසුම් පරීක්ෂණ හා සංවර්ධන කොට්ඨාසය
ඉඩම් කොට්ඨාසය
අභ්‍යන්තර විගණන හා විමර්ශන කොට්ඨාසය
සොරකුරු හා ප්‍රචාරක කොට්ඨාසය
MM 1-1
දිස්ත්‍රික් /නගර කාර්යාල
මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන අංශය
මූල්‍ය අංශය
තක්සේරු අංශය
කළාප/උප කාර්යාල
JM 1-1
සංවර්ධන අංශය
දේපල හා ඉඩම් කටයුතු අංශය
සැලසුම් අංශය
මානව සම්පත් කළමනාකරණ අංශය
සංවර්ධන අංශය
මූල්‍ය අංශය
MM 1-1
දිස්ත්‍රික් කාර්යාල
නගර කාර්යාල
JM 1-1
ඩෙහිඅත්ත කණ්ඩිය කළාප කාර්යාලය
බදුල්ලේ උප කාර්යාලය
බුද්ධාපිටිය කළාප කාර්යාලය
මහව කළාප කාර්යාලය
හන්තාන කළාප කාර්යාලය
මහනුවර කළාප කාර්යාලය
කොළඹ නගර උතුර
කොළඹ නගර දකුණ
වැලිමඩ උප කාර්යාලය
කොළඹ කළාප කාර්යාලය
මහරගම කළාප කාර්යාලය
කඩවත කළාප කාර්යාලය
කොට්ටාව කළාප කාර්යාලය
කැස්බෑව කළාප කාර්යාලය
කඩවත කළාප කාර්යාලය
කඩවත කළාප කාර්යාලය
කඩවත

3. ප්‍රධාන ක්‍රියාකාරකම්

✓ **''ඔබට ගෙයක් - රටට හෙටක්'' ණය වැඩසටහන**

- අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ණය පහසුකම් ලබාදීම තුලින් නිවාස ඉදිකර ගැනීමට සහායවීම
- සහනදායී වාර්ෂික පොලියක් යටතේ පීවත්වන නිවස වැඩිදියුණු කර ගැනීමට හෝ නව නිවසක් ඉදිකර ගැනීමට ණය පහසුකම් ලබාදීම.

✓ **''ඔබට ගෙයක් - රටට හෙටක්'' ආධාර වැඩසටහන**

- මූල්‍යාධාර ලබාදීම තුලින් නිවාස ඉදිකර ගැනීමට සහායවීම
- දිළිඳු, ආබාධිත හා අසරණ පවුල් මෙන්ම රටට වැඩදායී සේවාවක් ඉටුකල විශේෂ සාමාජිකයන් සිටින පවුල් වෙනුවෙන් සෙවණ ආධාර ලබාදීම තුලින් නව නිවාස ඉදිකිරීම.

✓ **ඉන්දියානු ආධාර වැඩසටහන**

- ඉඩමක් හෝ නිවසක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉන්දියානු රජයේ මූල්‍යාධාර තුලින් උතුර හා දකුණ පළාත්වල නව නිවාස ව්‍යාපෘති ඉදිකිරීම.

✓ **විරු සුමිතුරු නිවාස වැඩසටහන**

- රට දැය වෙනුවෙන් දිවිපිදූ හා පූර්ණ ආබාධිත තත්වයට පත්වූ රණවිරු සාමාජිකයින් වෙනුවෙන් ආධාර ලබාදීම තුලින් නිවාස අවශ්‍යතා සපුරාලීම.

✓ **මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා නව නිවාස**

- ස්ථීර මාසික ආදායම් ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින් හා මැදි අදායම්ලාභී හා ඉහල ආදායම්ලාභී ව්‍යාපාරිකයින් සඳහා රාජ්‍ය හා පෞද්ගලික දායකත්වය තුලින් නව නිවාස ලබාදීමට සියලු පහසුකම් සහිත මහල් නිවාස ඉදිකරීම.

✓ **පැරණි නිවාස ක්‍රම නවීකරණය**

- පැරණි මහල් නිවාස ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- මහල් නිවාස අළුත් වැඩියා කිරීම.

✓ **නිවාස ඉදිකිරීම් හා සහාය සේවා සැපයීම**

- නිවාස යෝග්‍යතා අධ්‍යනය කිරීම.
- ප්‍රජාව දැනුවත් කිරීම සහ සංවිධානය කිරීම.
- ග්‍රාමීය නිවාස කමිටු පිහිටුවීම.
- නිවාස ඉදිකිරීම් සඳහා අවශ්‍ය තාක්ෂණ සහාය ලබාදීම.
- අඩු පිරිවැය ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමවේදයන් ගැන තොරතුරු ව්‍යාප්ත කිරීම.
- අවශ්‍යතාවය මත මුල්‍යමය සහාය සැපයීම.
- ඉදිකිරීම් වල තත්වය/ අනුකූලතාවය සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීම.
- යටිතල පහසුකම් ඇති කිරීම/ සම්බන්ධතාවය පැවැත්වීම.

✓ නාගරික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම (නිවාස ව්‍යාපෘති)

- යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීම.
- මැනුම් කටයුතු සිදුකිරීම.
- මූල්‍යමය හැකියා මට්ටම් තීරණය කිරීම.
- සැලසුම් පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.
- අයිතිය පැවරීම.

✓ ඉඩම් කට්ටි ලබාදීම.

- යෝග්‍ය භූමි හඳුනා ගැනීම.
- යෝග්‍යතා අධ්‍යනය කිරීම.
- කැබැලි සැලසුම් පිළියෙල කිරීම.
- අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ඉඩම්ලාභීන් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම.
- අවශ්‍යනම් ණය දෙන ආයතන සමග සම්බන්ධතාවය ඇති කරගැනීම.
- තෝරාගත් ඉඩම් ලාභීන්ට ඉඩම් කට්ටි පැවරීම.
- නිශ්චිත කාල පරාසයක් තුල එම ඉඩම් වල ප්‍රතිලාභීන්ට නිවාස ඉදිකර ගැනීමට මග පෙන්වීම.

✓ ණය අයකිරීම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

- වාර්ෂික ඉලක්ක ලබා දීම, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම, ඊට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ණය හා කුලී ආදායම් ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- මාසික ප්‍රගති සමාලෝචනය කිරීමට හා ඒවායේ දුර්වලතා හඳුනාගෙන පිලියම් යෙදීම.
- ණයකරුවන්ට තම ණය වාරික ආපසු ගෙවීමේ වගකීම හා ණය ගෙවීමේ වැදගත්කම තුලින් නැවත නිවාස සංවර්ධනයට එම මුදල් යෙදවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අයකිරීම් නියෝජිතයින් හා අයකිරීම් නිලධාරින් සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- ආදායම් ප්‍රවර්ධන වැඩසටහන තුල දක්වන දායකත්වය ඇගයීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

✓ නිවාස සම්බන්ධ උපදේශන සේවා

- දිස්ත්‍රික් නිවාස උපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- යෝග්‍යතා වාර්තා සකස් කිරීම.
- අවශ්‍ය අවස්ථාවේදි නිවාස සැලසුම් සැපයීම.
- ප්‍රමාණ / ද්‍රව්‍ය ලයිස්තු / පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- සැලසුම් සඳහා අනුමැතියන් ලබා ගැනීම.
- ඉදිකිරීම් අධීක්ෂණය සහ තත්ව සහතික වීම.
- ඉදිකිරීම් දත්ත බැංකුවක් පවත්වාගෙන යාම.
- අඩු වියදම් තාක්ෂණික ක්‍රම පිළිබඳව දත්ත පවත්වාගෙන යාම.

✓ **නිවාස ක්‍රමවල පොදු ප්‍රදේශ, එහි යටිතල පහසුකම් සහ සේවාවන් සහිතව පළාත් අධිකාරියට පැවරීම.**

- පොදු ප්‍රදේශ / විවෘත ස්ථාන වල මායිම් සලකුණු කිරීම.
- මිනින්දෝරු සැලසුම් පිළියෙල කිරීම.
- පළාත් අධිකාරියෙන් එකඟතාවය ලබා ගැනීම.
- ඔප්පුවක් මගින් දේපල පැවරීම.
- නිවාස හිමියන්ට දැනුම් දීම.

✓ **නිවාස තොග හා නිවාස අවශ්‍යතාව පිළිබඳව දත්ත පවත්වාගෙන යාම.**

- ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සම්බන්ධීකරණය සහ දත්ත රැස් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උපදේශන මධ්‍යස්ථාන සමග සම්බන්ධීකරණය සහ දත්ත ඒකරාශී කිරීම.
- පළාත් අධිකාරි සමග සම්බන්ධීකරණය සහ දත්ත රැස්කිරීම.
- දිස්ත්‍රික් නිවාස කමිටුව වෙත දත්ත ඉදිරිපත් කිරීම.
- කමිටුව භාර ගත් දත්ත පෙල ගැස්වීම.
- දත්ත, අර්ධ වාර්ෂිකව දත්ත බැංකුව වෙත ඉදිරිපත් කිරීම.
- අනාගත සැලසුම් සඳහා දත්ත භාවිතයට ගැනීම.

4. මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

නිවාස සංවර්ධන කොට්ඨාශය

"ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ආධාර වැඩසටහන

පරමාර්ථය

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ***"රට හදන සෞභාග්‍යයේ දැක්ම"*** ප්‍රතිපත්ති ප්‍රකාශය තුල ඵලදායි පුරවැසියෙක් සහ සතුටින් ජීවත් වන පවුලක් නිර්මාණය කිරීම සඳහා සෑම පවුලකටම සුව පහසු නිවසක් අත්කර දීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමේ අරමුණට ලඟාවීමේ පළමු පියවර ලෙස ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පය හා මාර්ගෝපදේශකත්වය හා නියෝග අනුව දිවයිනේ අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටලුව විසඳීම නිවාස ඒකක 14,022 ක් ඉදිකරදීමේ අරමුණින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

කාර්යයභාරය

ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සකස් කල අත්වැලෙහි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට අනුව ප්‍රමුඛතාවය ලබාදිය යුතු පරිදි තෝරාගත් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය කමිටුවේ පොදු එකගතාවය පරිදි නිසි ප්‍රමුඛතාවයද සටහන් කරමින් ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීම ග්‍රාම නිලධාරි විසින් සිදුකර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීම පිණිස ප්‍රාදේශීය නිවාස කමිටු රැස්වීම පවත්වා ප්‍රමුඛතා ගත කරන නාම ලේඛනය සඳහා අනුමැතිය ලබාගැනීම සිදුකරනු ලබයි.

අනුමත කරනු ලබන ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය වැඩ සටහන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම පිණිස නොපමාව දිස්ත්‍රික් ලේකම් වෙත සහ නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු වෙත ඉදිරිපත් කරනු ලබයි.

වැඩසටහන ජාතික මට්ටම සමග සම්බන්ධීකරණය කරමින්, සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරයාගේ එකගතාවය මත දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් නිවාස කමිටුව හරහා ක්‍රියාත්මක කිරීමට ජාතික නිවාස සංවර්ධන

අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු විසින් පියවර ගනු ලැබේ.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සහ දිස්ත්‍රික් නිවාස කමිටුවේදී ප්‍රගතිය සමාලෝචනය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු විසින් කටයුතු කරනු ලබන අතර, ජාතික මට්ටම වෙත නියමිත පරිදි ප්‍රගතිය වාර්තා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ආදාළ නිළධාරින්ගේ සහයෝගය ලබාගෙන සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ කටයුත්ත අදාළ දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් සිදු කරනු ලබයි.

2021.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය

2021 වර්ෂයේ ඉලක්කගත නිවාස ඒකක 14,022 න් නිවාස ඒකක 12,231 ක වැඩ ආරම්භ කර 2021.12.31 දිනට ඉන් නිවාස ඒකක 4,078 ක වැඩ අවසන් කර ඇත. 2021 වර්ෂයේ ආරම්භ කරන ලද නිවාස ඒකක වලට අදාළ ඇස්තමේන්තු මුදල රු. මිලි. 7,383.650 ක් වන අතර ඉන් 2021.12.31 දිනට වැය කල මුදල රු. මිලි. 4,603.987 කි.

'ඔබට ගෙයක් - රටට හෙටක්' විසිරි නිවාස ණය වැඩසටහන

පරමාර්ථය

ස්ථිර නව නිවසක් නොමැති පවුල් ඒකක සඳහා නව නිවසක් ඉදිකිරීම හා ස්ථිර නිවසක් ඉදිකර ඇතත් වැඩ අවසන් නොවූ ඉදිකිරීම්වල වැඩ අවසන් කර ගැනීම, වැඩ නිම කර ඇති නිවාසවල අලුත් වැඩියා කටයුතු කිරීම හා ස්ථිර නිවසට අලුතින් කොටසක් එකතු කිරීම සඳහා සහායවීම මූලික පරමාර්ථ වශයෙන් පදනම් කරගෙන පවුල් ඒකකයක් වෙත අංග සම්පූර්ණ නිවසක ජීවත් වීමට අවස්ථාව සලසා ගැනීමේ අභිමාතාර්ථය මුදුන් පැමිණවීම.

මෙම සංවර්ධන කාර්යයයේ උපාය හා මූලික පරමාර්ථ වනුයේ

- නිවසක් නොමැති ඉඩමක් හිමි ආර්ථික හැකියාවක් ඇති අය වෙනුවෙන් ඔවුන්ගේම නිවසක අවශ්‍යතාවය සඳහා දිරි ගැන්වීම.
- නිවසක අවශ්‍යතාවය සපුරා ගැනීමට ආර්ථික හැකියාවක් නොමැති නමුත් නිවසක් අවශ්‍යතාව ඇති පවුල් ඒකක වලට තමන්ගේම නිවසක ජීවත්වීමේ අභිලාශය මුදුන් පැමිණවීම.
- එකම කුටුම්භයක පවුල් ඒකක කිහිපයක් ජීවත් වන, තමන්ගේම නිවසක ජීවත්වීමේ අභිලාශය ඇති, නමුත් දැනුම නොතිබීම, ඉඩමක හිමිකම නොමැතිවීම, ආරක්ෂිත නිවසක් ඉදිකර ගැනීමට හැකියාවක් නොතිබීම වැනි අවස්තාවලදී ඔවුන්ගේ නිවාස සිහිනය මුදුන්පත් කිරීම.
- ප්‍රජා සහභාගීත්වය දායකකර ගනිමින් ප්‍රජා පාදක ක්‍රමවේද ගුරු කොට ගෙන ශ්‍රී ලංකාවේ නිවාස ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කිරීම.
- නිවාසලාභි පවුල් වෙත තම නිවාස ඉදිකර ගැනීම සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීම හා ඉදිකිරීම් සුපරීක්ෂාකාරීත්වය තුළින් ප්‍රතිලාභින් වෙත සහාය ලබාදීම හා එමගින් ප්‍රමිතිගත නිවාස ඉදිකරවීම.
- නිවාසලාභි ප්‍රජාවගේ කැපවීම හා නිර්මාණශීලිත්වයන්ට අවශ්‍ය කරන දිරිගැන්වීම් ලබාදීම, මගපෙන්වීම හා සහායදීම.
- නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හවුල්කාර ආයතනවල දායකත්වයෙන් ඒකාබද්ධ වැඩ සටහනක් ලෙස මෙම වැඩ සටහන සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ගම් මට්ටම දක්වා විමධ්‍යගත ක්‍රමවේදය මත ක්‍රියාත්මක කිරීම.

වැඩසටහනේ කාර්යයභාරය

වර්ථමාන, සමාජ ආර්ථික ජීවන රටාව තුළ පදිංචිය සඳහා සුදුසු නිවසක් ඉදිකරගැනීම සඳහා සත්‍ය වශයෙන්ම ආර්ථික හැකියාව ඉතා අවම , එහෙත් ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවසේ වැඩ අවසන් නැති හෝ අබලන් නිවස අලුත් වැඩියා කර ගැනීම සඳහා හෝ දැනට ඇති නිවසට කොටසක් එක්කරගැනීමේ අවශ්‍යතාවය ඇති පවුල් මේ සඳහා තෝරා ගැනේ. මෙම වැඩ සටහන දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පාදක කොටගනිමින් ක්‍රියාත්මක කෙරේ.

නව නිවාස ණය වැඩසටහන

උපරිම මාසික ආදායම රු. 75,000/- ක් හෝ ඊට අඩු ආදායම් සහිත ප්‍රතිලාභින් හට නව නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය මත රු. 500,000/- සිට රු. 1,000,000/- ක ණය මුදලක් වසර 5 හා 10 ක කාල සීමාවක් තුළ 6% සිට 9% ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගත හැක.

ණය මුදල අනුමත කිරීමට පෙර නිවසේ වැඩ නිම කරගැනීමට ඇති හැකියාව පිළිබඳ අවශ්‍ය තාක්ෂණික වාර්තා ලබාගැනීමට අවධානය යොමු කිරීම දිස්ත්‍රික් කළමනාකරුගේ කාර්යය භාරය වේ.

වැඩි දියුණු නිවාස වැඩ සටහන

උපරිම මාසික ආදායම රු. 75,000/- ක් හෝ ඊට අඩු ආදායම් සහිත ප්‍රතිලාභීන් හට වැඩිදියුණු නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය මත රු. 300,000/- දක්වා උපරිම ණය මුදලක් වසර 5 හා 10 ක කාල සීමාවක් තුළ 6% සිට 7% ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගත හැක.

ණය මුදල අනුමත කිරීමට පෙර නිවසේ වැඩ නිම කරගැනීමට ඇති හැකියාව පිළිබඳ අවශ්‍ය වාර්තා ලබාගැනීමට අවධානය යොමු කිරීම දිස්ත්‍රික් කළමනාකරුගේ කාර්යය භාරය වේ.

ඉන්දියානු ආධාර ආදර්ශ ගම්මාන වැඩ සටහන

මෙම වැඩ සටහන යටතේ ඉන්දියානු රජයේ අරමුදල් භාවිතයෙන් අඩු ආදායම්ලාභී පවුල් 2400 ක් සඳහා එක් පවුලකට එක් නිවසක් බැගින් නිවාස ඉදිකිරීම වෙනුවෙන් රු. ලක්ෂ 5 ක නිවාස ආධාරයක් ලබාදීම සිදුවේ.

ඒ යටතේ 2019 වසරේ අවිච්ඡේද වූ නිවාස 1775 ක් සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මි. 428.725 ක් වන අතර, ඉන් රු. මිලි. 36.220 ක ආධාර මුදලක් ප්‍රතිලාභීන් වෙත නිදහස් කර ඇත. ඒ අනුව නිම කර ඇති නිවාස සංඛ්‍යාව 439කි.

දේපළ කළමනාකරණ කොට්ඨාශය

මෙම අධිකාරියට අයත් නිවාස ක්‍රමවල නිවාස හා ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 8/1 වගන්තියට අනුව අනුමැතිය ලබා ගැනීමට දිස්ත්‍රික් කාර්යාල යොමු කරන ලද ප්‍රතිලාභීන්ගේ ලිපිගොණු සංඛ්‍යාව 2549 කි. ඒ අතරින් පරීක්ෂාවට ලක්කර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන දිස්ත්‍රික් කාර්යාල වෙත ඔප්පු සකස් කිරීම සඳහා යොමු කල ලිපි ගොණු සංඛ්‍යාව 1759 කි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත නිවාස සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

- රජයේ ඉඩම් පවරා ගැනීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් පවරා ගැනීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඇති බලතල ප්‍රකාරව ටෙන්ඩර් පටිපාටියට අනුව පුද්ගලික ඉඩම් පවරා ගැනීම.
- වෙනත් රාජ්‍ය ආයතන සතු පෞද්ගලික ඉඩම් පවරා ගැනීම.

2021 වර්ෂයේදී ඉඩම් 3 ක හිමිකම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත.

ඉලක්ක සපුරා ගැනීම

- රජයේ ඉඩම් අඥා පනත යටතේ දීමනා පත්‍ර මගින් පවරා ගත යුතු ඉඩම් 301 ක කටයුතු දැනටමත් නිම වෙමින් පවතී.
- 2021 වර්ෂය තුල ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව 44 වන වගන්තිය යටතේ සහතිකය මගින් ඉඩම් 02 ක් පවරා ගෙන ඇත
- 44 වගන්තිය ලබා ගැනීම සඳහා සම්පූර්ණයෙන් වන්දි හා පොලි ගෙවා අවසන් කරන ලද, ඉඩම් ගණන 02 කි.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා වන්දි ගෙවීමෙන් අනතුරුව ඉඩම් 18 ක අයිතිය ලබා ගැනීම සඳහා අවසන් අදියරට පැමිණ ඇත.
- පෞද්ගලික ඉඩම් 05ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට අදාලව ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.
- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවලට අදාල ලබා දී ඇති ඉඩම් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත වන්දි ලබාගැනීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.

2021 වර්ෂයේදී මැනුම් අංශය මඟින් සිදුකරන ලද රාජකාරි

2021- මැණුම්

අනු අංකය	මැ. නි. අංකය	දිනය	දිස්ත්‍රික්කය	ඉඩමේ නම	පිඹුරු අංකය	කාර්යය	ප්‍රමාණය		
							අ.	රූ.	පර්.
1	8/52/1/න/108	2021.12.28	කොළඹ	මාලිගාවත්ත	1400	කොා/න/104 හි කැබලි අංක 26න් පර්. 4ක් වෙන් කිරීම	0	0	4
2	8/5/2/1/18/84	2021.12.24	කෑගල්ල	ඇත්නාවල		F. V. P. 115 හි ඇත්නාවල ප්‍රවේශ මාර්ග හා රක්ෂිත වෙන් කිරීම	0	3	17.98
3	8/5/2/2/209	2021.12.24	ගම්පහ	උලු අම්බලම්වත්ත		මායිම් නැවත විවෘත කිරීම	0	3	21.9
4	8/5/2/8/99	2021.12.6	මාතර	දුවව්වත්ත		මු. පි. මාර 1316න් පර්. 10 වෙන් කිරීම	0	0	10
5	8/5/5/16/2018	2021.12.21	ගම්පහ	කණ්ඩලම්		මායිම් විවෘත කිරීම	1	0	15
6	8/5/2/19/108	2021.8.21	රත්නපුර	විකිලියවත්ත	1371-1,4,6,9	F. V. P. 303 කටවි කැඩීම	15	2	10.38
7	8/5/2/1/107	2021.11.10	කොළඹ	වලව්වත්ත		අංක 120 හි කැබලිඅංක 2හි මායිම් පෙන්වීම	0	0	6.04
8	8/5/2/20/104	2021.10.27	කෑගල්ල		7944.7572	මහල් නිවාස ක්‍රමයක් සඳහා ප්‍රවේශ මාර්ග මැනීම	1	0	32.97
8	8/5/2/1/100 ii	2021.10.21	කොළඹ	මත්තේගොඩ	1306	කොා 145 හි කැ. අං. 366න් බෝධිය සඳහා පර්. 1ක් මානීම	0	0	1.92
9	8/5/2/1/න/2	2021.09.29	කොළඹ	ඩාර්ලි පාර		පිඹුරු අංක 565 හි මායිම් විවෘත කිරීම	1	0	26.49
10	8/5/1/76 iii	2021.07.21	යාපනය	නාවත්කුලි	1196	ya/chv/2016/327 කටවි කැඩීම	7	3	2.99
11	8/5/1/76 iii	2021.07.21	යාපනය	නාවත්කුලි	1176	ya/chv/2016/328 කටවි කැඩීම	28	1	17.87
12	8/5/2/2/202	2021.04.05	ගම්පහ	වැරැල්ලවත්ත	2549	මධ්‍යම පාන්තික අදියර 1, අදියර 11 වට මැනීම	5	3	0
13	8/5/2/1/131	2021.04.28	කොළඹ	බදුවත්ත- වුඩ්ලන්ඩ්		මු. පි. කොා.6 977 හි කැ. අං. 45 ප්‍රවේශ මාර්ගයේ මායිම් නගර සභාවට පෙන්වා දීම	0	0	4.15
14	8/5/3/14/49	2021.04.23	අනුරාධපුර	කුඹිච්චවන්කුලම	262 c	මහල් නිවාස ක්‍රමයක් සඳහා මායිම් පෙන්වා දීම	3	0	15.51
15	8/5/2/2/187	2021.04.23	ගම්පහ	වැවිගොඩැල්ල		මහල් නිවාස ක්‍රමයක් සඳහා ප්‍රවේශ මාර්ග මැනීම	0	3	9.29
16	8/5/2/2/63iii	2021.04.24	ගම්පහ	වැරැල්ලවත්ත	1146	අංක 2549 - මධ්‍යම පාන්තික අදියර 1 සඳහා නව පිඹුරක් සැකසීම	1	2	35.33
17	8/5/2/2/63iii	2021.04.09	ගම්පහ	රන්පොකුණගම	1141	ගම් 147-කැ.අංක 2100න් කොටසක් මැනීම-sec	2	1	34.88
18	8/5/2/2/63iii	2021.04.09	ගම්පහ	රන්පොකුණගම	1113	ගම් 147-කැ.අංක 262න් කොටසක් මැනීම -nerd	3	0	8.31
19	8/5/2/2/63iii	2021.04.09	ගම්පහ	රන්පොකුණගම	1114	ගම් 147-කැ.අංක 2101න් කොටසක් මැනීම -sec	2	2	13.48
20	8/5/2/2/63iii	2021.03.23	ගම්පහ	රන්පොකුණගම	1064	ගම් 147-කැ.අංක 262න් කොටසක් මැනීම	1	1	26.68
21	8/5/2/2/63iii	2021.03.23	ගම්පහ	රන්පොකුණගම	1065	ගම් 147-කැ.අංක 1950 මැනීම	2	3	4.4
22	8/5/2/2/63iii	2021.03.23	ගම්පහ	රන්පොකුණගම	1064/1	1064 සමෝච්ඡ රේඛා මැනීම	1	1	26.68
23	8/5/2/2/63iii	2021.03.23	ගම්පහ	රන්පොකුණගම	1065/1	1065 සමෝච්ඡ රේඛා මැනීම-nerd	2	3	4.4
24	8/5/2/2/63iii	2021.03.23	ගම්පහ	රන්පොකුණගම	1064/2	1064 සංශෝධනය කර මැනීම(අනවසර අල්ලා ගැනීම් ඉවත්කර)	1	1	28.86
25	8/5/2/2/63iii	2021.04.09	ගම්පහ	රන්පොකුණගම	1141/1	1141 සමෝච්ඡ රේඛා මැනීම	2	1	34.88
26	8/5/2/2/63iii	2021.04.09	ගම්පහ	රන්පොකුණගම	1113/1	1113 සමෝච්ඡ රේඛා මැනීම	3	0	8.31
27	8/5/2/2/63iii	2021.04.09	ගම්පහ	රන්පොකුණගම	1114/1	1114 සමෝච්ඡ රේඛා මැනීම	2	2	13.48
28	8/5/2/1/54	2021.02.19	කොළඹ	සොයිසාපුර		කොා 231හි කැ. අං. 87 -කාර්යාල භූමිය මැනීම	1	0	7
29	8/5/2/2/63iii	2021.02.16	ගම්පහ	රන්පොකුණගම	195	ජල ටැංකිය හා එයාටෙල් කුළුණ සඳහා මැනීම	0	0	20
30	8/5/2/1/න/108ii	2021.02.05	කොළඹ	සංඝරාජ මාවත	782A		0	1	26.94
31	8/5/2/2/187	2021.02.01	ගම්පහ	වැවිගොඩැල්ල	997	මහල් නිවාස ක්‍රමයක් සඳහා බිම් මැනීම	0	3	9.29
32	8/5/2/1/54ii	2021.03.09	කොළඹ	සොයිසාපුර	1038	මහල් නිවාස ක්‍රමය සඳහා සභාධිපත්‍ය මැනීම	0	1	3.39
						එකතුව	97	0	22.8

- දේපළ කළමණාකරණ කොට්ඨාශය වෙත 2021 වර්ෂය තුල 6940ක ලිපි ප්‍රමාණයක් ලැබී ඇති අතර, පවතින චක්‍රලේඛ උපයෝගි කරගෙන දේපළ කළමනාකරණ ගැටළු සඳහා විසඳුම් ලබා දීම සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 110ක් යොමුකර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 97ක් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකර ඇත.

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය පහත අංශ වලින් සමන්විත වේ.

- ඉංජිනේරු අංශය
- වාස්තු විද්‍යා අංශය
- ප්‍රමාණ සමීක්ෂණ අංශය
- සැළසුම් අංශය
- විදුලි අංශය
- නඩත්තු අංශය
- ව්‍යාපෘති අංශය
- පාලන අංශය
- පරිශ්‍ර අංශය

2021 වර්ෂය තුලදී පහත සඳහන් වැඩසටහන් මගින් සියළු ජන කොටස් වල නිවාස අරමුණු හා ඒ සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කර ඇත.

2021 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති පහත පරිදි වේ

නගමු පුරවර

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	ප්‍රගතිය 2021.12.31 දිනට		වෙනත්
			භෞතික	මූල්‍ය	
1	සොයිසාපුර නිවාස ක්‍රමයේ අංක A/3/1/4 නිවසෙහි ජල රෝධනය කිරීම	01	100%	0.35	බිල් ගෙවා අවසන් කර ඇත. රැඳවුම් මුදල නිදහස් කර නැත.
2	සාමපුර ගොඩනැගිලි වල ජල ටැංකි නවීකරණය	-	100%	0.63	බිල් ගෙවා අවසන් කර ඇත රැඳවුම් මුදල නිදහස් කර ඇත.
3	සාංචිආරච්චිවත්ත නිවාස ක්‍රමය	224	42%	31.00	
4	ඇලපිටිවල නිවාස ක්‍රමයේ ජල ටැංකිය, මළනල හා කාණු ප්‍රතිසංස්කරණය කිරීම	160	90%	-	
5	හිඹුටු උයන මළපවාහන පද්ධතිය අළුත්වැඩියාව	248	--	--	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ. නව ඇස්තමේන්තුව ලැබීමට යටත්ව රු මිලි 26ක් එම ආයතනයට ගෙවා ඇත.
6	ඌරාවත්ත දියවරපුර නිවාස ව්‍යාපෘතියේ අළුත්වැඩියා කටයුතු	64	90%	11.48	ධීවර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් සිදුකරනු ලැබේ.

ගම්පෙරළිය (අවිච්ඡේද)

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	ප්‍රගතිය 2021.12.31 දිනට		වෙනත්
			භෞතික	මූල්‍ය	
1	මව්ලානාවත්ත නිවාස ක්‍රමය අදියර 1 අදියර 11	 62 56	 100% 100%	 37.38 32.93	බිල් ගෙවා අවසන් කර ඇත රැඳවුම් මුදල නිදහස් කර ඇත.
2	ශාන්ත ජේම්ස් වීදිය නිවාස ක්‍රමය	180	100%	36.31	බිල් ගෙවා අවසන් කර ඇත රැඳවුම් මුදල නිදහස් කර ඇත.
3	නිව්හැම් නිවාස ක්‍රමය	105	11%	11.19	කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතිය නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර තීරණය ලැබී ඇත. ඒ අනුව දෙපාර්ෂවයේ එකඟතාවය පරිදි ව්‍යාපෘතිය නතර කිරීමට කටයුතු කරමින් පවතී.

පෙර විකුණුම් මහල් නිවාස ව්‍යාපෘති

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	භෞතික ප්‍රගතිය 2021.12.31 දිනට	කොන්ත්‍රාත්කරු
1	තංගල්ල නිවස ව්‍යාපෘතිය	30	84%	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
2	සොයිසාපුර නිවාස ව්‍යාපෘතිය	30	38%	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
3	වැරැල්ලවත්ත නිවාස ව්‍යාපෘතිය	154	6%	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
4	ගම්පහ වැවේගොඩැල්ලවත්ත නිවාස ව්‍යාපෘතිය	40	15%	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
5	රංපොකුණගම නිවාස ව්‍යාපෘතිය	72	A - 19% B - 14% C & D - 5% F - 2% E - 0%	GDP ඉංජිනියරින් පෞද්ගලික ආයතනය ක්‍රියා කරයි.

පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නාගරික සංවර්ධන අධිකාරිය, පලාත් පාලන ආයතනය සහ අනෙකුත් ආයතන අනුමැතීන් ලබා ගැනීමට ක්‍රියා කර ඇත.

- කොහොලන්කල අඩු ආදායම් හා මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- සොයිසාපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- වැරැල්ලවත්ත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- අනුරාධපුර දහයියාගම මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

ත්‍රස්ත ප්‍රහාරයෙන් අවතැන්වූවන් සඳහා ඉදිකරන ලද කටුවාපිටිය නිවාස ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීම් හා ඉංජිනේරුමය දායකත්වය මෙම අංශය විසින් ලබා දී ඇත.

රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ නිවාස ව්‍යාපෘති

මෙම වැඩසටහන මධ්‍යම පාන්තික නිවාසලාභීන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා පිහිටුවන ලද්දකි. දේශීය / විදේශීය පුද්ගලික ආයතනය සමඟ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය රාජ්‍ය හා පෞද්ගලික ඒකාබද්ධ ගිවිසුමකට එළඹ පෙර විකුණුම් පදනම යටතේ මෙම නිවාස ඉදිකරනු ලැබේ.

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ප්‍රගතිය 2021.12.31 දිනට
1	හන්තාන - අදියර II	82	5.5% නඩු කටයුත්තක් පවතී. උසාවි නියෝගය ලැබීමට යටත්ව නිවාස 11 ක් ඉදිකිරීමට අවසර ලබා දී ඇත. මේ වන විට නිවාස 7 ක් ඉදිකරමින් පවතී.
2	හන්තාන - අදියර III	20	
3	යක්කල, සියනෑ උයන සොබා උයන නිවාස ව්‍යාපෘතිය	42	90%
4	කළුගල පල්ලෙකැලේ රීජන්සි උද්‍යාන නිවාස ව්‍යාපෘතිය අදියර I අදියර II	 11 10	 85% 70%

ප්‍රසම්පාදන කටයුතු

2021 වර්ෂය තුල නිවාස ක්‍රම වල අත්‍යාවශ්‍ය කටයුතු, සංචාරක බංගලා සහ ප්‍රධාන කාර්යාලය තුල නවීකරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා ඇති ගණන 10 ක් වන අතර, එම ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් ප්‍රධාන කිරීමේ ලිපි නිකුත් කර ඇත.

සභාධිපත්‍ය දේපළ

2009.12.31 දිනට පෙර පලාත් පාලන අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති සඳහා 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ ඔප්පු ලබා දීමට ක්‍රියා කල හැකි අතර ඒ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිවාස පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගොඩනැගිලි තත්ව පිළිබඳව නිකුත් කරන සහතිකය පදනම් කර ගනු ලැබේ.

ඒ අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු නිළධාරීන් සමඟ සම්බන්ධීකරණය වී නිවාස පරීක්ෂා කිරීම් හා ඉදිරි කටයුතු සිදු කෙරේ.

2021 වර්ෂයට අදාලව නිවාස ක්‍රම 24 කට අදාළ පිඹුරු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට යවා ඇති අතර 13 ක් එහි නිළධාරීන් විසින් පරීක්ෂා කර ඇත. නිවාස ක්‍රම 04 කට වාර්තා එවා ඇති අතර නීති අංශය විසින් සභාධිපත්‍ය පිඹුර හා සභාධිපත්‍ය ප්‍රකාශන, එකී වාර්තා ඉඩම් ලියාපදිංචි කාර්යාලය වෙත යොමු කර ඇත.

පොම්පාගාර නඩත්තු කටයුතු

හිඹුටු උයන හා මුල්ලේරියාව නිවාස ක්‍රමයේ මලාපවාහන නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරුවෙකු ලවා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කර ඇත.

විදුලි නඩත්තු කටයුතු

සේවා අවශ්‍යතාවය අනුව ප්‍රධාන කාර්යාලයේ සහ නිවාස ක්‍රම වල විදුලි නඩත්තු කටයුතු සිදු කර ඇත

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය

ආයතනයේ මිනිස් බල සැලැස්ම ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන මෙහෙයුම් ඒකකය මානව සම්පත් කළමනාකරණ අංශයයි. මේ මගින් ආයතනික මානව සම්පත් කළමනාකරණයට අදාළ නීතිරීති හා රෙගුලාසි සම්පාදනය කරනවා මෙන්ම අධිකාරියේ පනතේ සඳහන් නියමයන්ට අනුව ආයතන ඵලදායි ඉලක්ක ගත නිවාස සංවර්ධන වැඩසටහන කරා මෙහෙය වීමට අවශ්‍ය මිනිස් බලය කළමනාකරණය කිරීම මෙම අංශය මගින් සිදු වේ. ඒ අනුව බදවා ගැනීම්, උසස්වීම්, ස්ථාන මාරුකිරීම්, සේවක ආරවුල් විසඳීම්, කම්කරු ආරවුල් සඳහා පෙනී සිටීම, සේවක අභියාචනාවන්ට ප්‍රතිචාර දැක්වීම යනාදී කාරණාවන් බොහොමයක් සඳහා පෙනී සිටී.

2021 වර්ෂය තුල මානව සම්පත් අංශය තුල සිදු වූ වෙනස්වීම් පහත පරිදි වේ.

- 2021.12.31 දිනට භෞතික කාර්ය මණ්ඩල සාරාංශය පහත පරිදි වේ.

අනු අංකය	සේවා මට්ටම	අනුමත		භෞතික සේවක සංඛ්‍යාව (2021.12.31 දිනට)			
		ස්ථිර	පෞද්ගලික වනසේ	ස්ථිර	කොන්ත්‍රාත්	දෛනික	සේවා ගිවිසුම්
01	ජ්‍යෙෂ්ඨ	206	2	89	-	-	-
02	තෘතිය	252	101	319	-	-	-
03	ද්විතීය	893	387	942	-	-	-
04	ප්‍රාථමික	219	104	217	-	-	-
එකතුව		**1570**	**594**	**1567**	**246**	**31**	**05**

- 2021.12.31 න් අවසන් වර්ෂය තුල සිදුකරන ලද බඳවාගැනීම් පිළිබඳ සාරාංශය පහත සඳහන් පරිදි වේ.

සෘජු බඳවා ගැනීම්				විශ්‍රාම ගැන්වීමෙන් පසු නැවත සේවය බඳවා ගැනීම්		එකතුව
ස්ථිර		කොන්ත්‍රාත්	දෛනික			
විධායක	විධායක නොවන			සේවා ගිවිසුම්	දෛනික	
-	-	-	-	02	01	03

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා 2021 වර්ෂය තුළ අභ්‍යන්තර උසස්වීම් මගින් උසස්වීම් ලබා දීමක් සිදුකර නොමැත.

- 2021 වර්ෂය තුළ විශ්‍රාම ගැන්වීම්, සේවය අවසන් වීම්, ධූරය අතහැර යෑම් හා ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	සේවා මට්ටම	විශ්‍රාම ගැන්වීම්	සේවය අවසන්	ඉල්ලා අස්වීම්	ධූරය අතහැර යෑම්	සේවයෙන් පහ කිරීම්
01	ජ්‍යෙෂ්ඨ	07	-	02	-	01
02	තෘතිය	33	02	02	-	-
03	ද්විතීය	23	15	38	03	-
04	ප්‍රාථමික	08	02	03	01	-
එකතුව		**71**	**19**	**45**	**04**	**01**

- මෙම අධිකාරියේ සේවයේ නියුතුව සිටිය දී 2021 වර්ෂය තුළ මරණයට පත් වූ සේවක සංඛ්‍යාව 03 කි.
- මෙම අධිකාරියේ ප්‍රායෝගික පුහුණුව හා උපාධිධාරී පුහුණු ලාභීන් පහත පරිදි වේ.

  ප්‍රායෝගික පුහුණුලාභීන් සංඛ්‍යාව - 222

  උපාධිධාරී පුහුණුලාභීන් සංඛ්‍යාව - 13

- 2021 වර්ෂය තුල මානව සම්පත් කළමනාකරණ අංශය විසින් ඉටු කරනු ලබන දෛනික කාර්යයන්ට අමතරව සිදුකරන ලද විශේෂ කාර්යයන් පහත පරිදි වේ.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත 2018 මිනිස්බල ඇස්තමේන්තුවට අදාලව සේවා අවශ්‍යතාවය පවතින තනතුරු අනුමත නව කාර්ය මණ්ඩලයේ පවතින ගැටළු හා අතිරික්ත කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කිරීම.

පාලන අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ආයතන ප්‍රධානීන් විසින් ගනු ලබන තීරණ පිළිබඳව ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, නගර කාර්යාල හා උප කාර්යාල වෙත චක්‍රලේඛ/කාර්යාල නියෝග මගින් දැනුවත් කිරීම ඇතුළු පහත සඳහන් රාජකාරී මෙම අංශයේ රාජකාරී පථයට ගැනේ. මීට අමතරව කාර්ය මණ්ඩලයේ පරිපාලනයට අදාල පහත සඳහන් කාර්ය භාරයන් පාලන අංශයෙන් මෙහෙයවීම හා අධික්ෂණය යටතේ සිදුකරනු ඇත.

- කාර්යාල කළමනාකරණයට අදාල සියළුම චක්‍රලේඛ, ලිපි, ලේඛණ, කාර්යාල නියෝග හා විශේෂ දැන්වීම් ලිපි නිකුත් කිරීම හා ගොනු පවත්වා ගැනීම.
- ප්‍රධාන කාර්යාලයේ සමස්ථ කාර්යය මණ්ඩලයේ පැමිණීම හා සම්බන්ධ රාජකාරි කටයුතු
- වෛද්‍ය ප්‍රතිලාභ
- ආපදා ණය වැඩ සටහන
- මාණ්ඩලික නිවාස ණය වැඩ සටහන (සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා)
- රාජකාරී හැඳුනුම්පත් නිකුත් කිරීම හා නැවත භාර ගැනීම
- ඇගිළි සළකුණු යන්ත්‍ර පවත්වා ගැනීම හා ඊට අදාල සේවාවන්
- සන්නිවේදන පහසුකම් හා සම්බන්ධ කටයුතු
- දෛනික තැපැල් කටයුතු
- දිස්ත්‍රික් කාර්යාල/ කලාප කාර්යාලවල රාජකාරි කටයුතු හා ප්‍රධාන කාර්යාල ගෙවීම් කටයුතු
- ඉංජිනේරුවන්, ඉංජිනේරු සහකාරවරුන් හා තාක්ෂණ නිලධාරීන් ඇතුළු කේෂ්ත්‍ර නිලධාරයන්ගේ යතුරු පැදි සැතපුම් කුලි දීමනා ඉල්ලීම් කටයුතු
- දිස්ත්‍රික් කාර්ය මණ්ඩල දුෂ්කර සේවා ස්ථාන නිවාස කුලි දීමනා ගෙවීම් කටයුතු
- දිස්ත්‍රික් කාර්යාල/කලාප කාර්යාලවල සනිපාරක්ෂක කටයුතු හා සම්බන්ධ කටයුතු
- ප්‍රධාන කාර්යාලය ඇතුළු කාර්යාල ගොඩනැගිලි බදු/කුලි, රක්ෂණ කටයුතු, බදු ගෙවීම් කටයුතු
- කාර්යාල අලුත්වැඩියාවන් හා භාණ්ඩ මිලදී ගැනීම් හා අදාල කටයුතු
- ප්‍රධාන කාර්යාලයේ සමස්ථ කාර්යය මණ්ඩලයට අවශ්‍ය තේ සැපයීම්
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ලේඛණාගාරයන් පවත්වා ගැනීම

- නිවාස කොමසාරිස්/ නිවාස දෙපාර්තමේන්තුව සතු ලේඛණාගාරය පවත්වා ගැනීම හා ඊට අදාල කටයුතු
- ආයතනික ආපනශාලාව පවත්වා ගෙන යෑම
- ආයතනික ආරක්ෂක සේවාවන්ට අදාල බිල්පත් පරීක්ෂා කර ගෙවීම් සඳහා යොමු කිරීම හා ආරක්ෂක සේවාවන් සපයා ගැනීමේ කටයුතු
- සියළු විදුලි සෝපාන කටයුතු
- පොත් බැඳීම් කටයුතු
- බාහිර අමුත්තන් පිළිගැනීම හා සේවා අවශ්‍යතාවය හඳුනා ගෙන අදාල ස්ථානයන් වෙත යොමු කිරීම
- දුරකථන පණිවුඩ හුවමාරු මධ්‍යස්ථාන කටයුතු හා අභ්‍යන්තර දුරකථන පද්ධති කටයුතු සිදු කිරීම
- ප්‍රධාන කාර්යාලයේ 5 මහලේ පිහිටි සභා ශාලාවේ කටයුතු
- ප්‍රධාන කාර්යාලයේ අදාල අංශයන් වෙත පුවත්පත් සැපයීම
- සුළු මුදල් පොත පවත්වා ගැනීම
- භාණ්ඩ ඇනවුම් කිරීම හා ලේඛණ පවත්වා ගෙනයාම
- වට්ටෝරු ලේඛණය පවත්වා ගෙන යාම
- වෘත්තිය සමිති සම්බන්ධ කටයුතු
- මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශයෙහි අන්තර්ජාල, පරිගණක කටයුතු කිරීම

2021 වර්ෂයේ ප්‍රසාද දීමනා සේවකයින් වෙත ලබා දී ඇති අතර ආපදා ණය, යැපීම් දීමනා සංයුක්ත දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම හා දිස්ත්‍රික් කාර්යාලවල කුලී දීමනා ගෙවීම් කටයුතු අනුමත කිරීමේ කටයුතු සිදුකර ඇත.

ආපදා ණය ඉල්ලුම් කර ඇති සේවකයන් ගණන	ආපදා ණය ගෙවූ මුදල රුපියල්
131	32,750,000.00

ප්‍රධාන කාර්යාලයේ වැටුප් ලබන වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ සාමාජිකයින්ට පහත සඳහන් ආකාරයෙන් 2021 වර්ෂය සඳහා ගෙවීම් කර ඇත.

	ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු	ප්‍රතිලාභ ලද සාමාජිකයන් ගණන	මුදල (රු)
01	බාහිර ප්‍රතිකාර	364	5,180,199.00
02	නේවාසික ප්‍රතිකාර පරීක්ෂණ හා වෛද්‍ය ගාස්තු	17	506,998.00
03	නේවාසික ප්‍රතිකාර ශල්‍යකර්ම හා වෛද්‍ය සේවා ගාස්තු	20	106,616.00
04	බරපතල සැත්කම් හා අඛණ්ඩ ප්‍රතිකාර	12	1,675,027.00
05	රජයේ රෝහල් සඳහා නේවාසික ප්‍රතිකාර	11	31,600.00
06	බෝවන හා වසංගත රෝග	33	179,800.00
07	කා.නි. 2016/04 හි 08 ඡේදය අනුව ප්‍රතිලාභ	07	12,000.00
	එකතුව		7,692,240.00

2021 වර්ෂය තුළ දැරූ වියදම්

01.	කාර්යාලීය දුරකථන		5,394,000.00
02.	තැපැල් වියදම		505,575.00
03.	සීඝ්‍රගාමී තැපැල් / සුළු වියදම් (Petty Cash)		14,580.00
04	ප්‍රධාන කාර්යාල රක්ෂණ ආවරණය		1,364,141.61
05	මාතලේ දිස්ත්‍රික් කාර්යාල ගෙවල් කුළි		125,000.00
06	මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ රක්ෂණය		92,685.48
07	දුෂ්කර සේවා ගෙවල් කුළී දීමනාව ලබා දී ඇත		
08	යතුරු පැදි දීමනා ලබා දී ඇත		
09	තේ සලාකය සිනි කිලෝතේ කොළ ග්‍රෑම් 100		384,130.00
10	2021 වර්ෂයට පුවත්පත් මිලදී ගැනීම සඳහා වියදම		236,890.00
11	සුළු මුදල් අග්‍රමය මඟින් 2021 වර්ෂය තුලදි මිලදී ගැනීම වෙනුවෙන් වැයවූ මුදල		560.00

මාණ්ඩලික නිවාස ණය අංශය

මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල ස්ථිර සේවයේ නියුතු (පරිවාස කාලය අවසන් කරන ලද) කාර්ය මණ්ඩලය සඳහා 4.2% ක පොලී ප්‍රතිශතය යටතේ පහත සඳහන් නිවාස අරමුණු සඳහා දේපළ උගස්කරයක් මත රු. 1,500,000/-ක උපරිමයකට යටත්ව මාණ්ඩලික නිවාස ණය මුදල් ලබා දීම මෙම අංශයේ කාර්යභාරය වේ. මෙහිදී මූලික වැටුප හා වයස අවු.60 දක්වා ඉදිරි සේවාකාලය පදනම් කරගෙන ණය ලබාදීම සිදුකරන අතර ණය අයකර ගැනීමේ උපරිම කාලසීමාව අවු.15 කි.

නිවාස ණය දෙනු ලබන අරමුණු

- නව නිවසක් ඉදිකිරීම
- නිවසක වැඩ අවසන් කිරීම/පුළුල් කිරීම/ප්‍රතිසංස්කරණය කිරීම
- නිවසක්/ඉඩමක් මිලයට ගැනීම
- නිවාස අරමුණක් සඳහා පිළිගත් මූල්‍ය ආයතන මඟින් දේපළක් උගස්කර ලබා ගත් ණය මුදලක් බේරුම් කිරීම
- මෙම අධිකාරිය වෙතින් කුලී සින්න/ විකුණුම් පදනම මත ලබා ගත් නිවසක්/ මහල් නිවසක්/ ඉඩමක් මිලයට ගැනීම හෝ විකුණුම් මිලෙන් කොටසක් බේරුම් කිරීම

සම්පාදනය කල ඉලක්ක

2021වර්ෂය ණය ලබාදී ඇති අරමුණු

අරමුණ	සංඛ්‍යාව
නව නිවසක් ඉදිකිරීම	04
නිවසක වැඩ අවසන් කිරීම/පුළුල් කිරීම/ප්‍රතිසංස්කරණය කිරීම	07
නිවසක්/ඉඩමක් මිලයට ගැනීම	03

වැටුප් බාණ්ඩ පරාසය	ප්‍රධාන කාර්යාලය		දිස්ත්‍රික් කාර්යාලය		අනුමත කර ඇති මුළු මුදල (රුපියල්)
	සේවක සංඛ්‍යාව	මුදල (රුපියල්)	සේවක සංඛ්‍යාව	මුදල (රුපියල්)	
HM 2-1-MA 5-2	02	1,800,000.00	-	-	1,800,000.00
MA 2-2-MA 1-2	04	4,488,700.00	06	7,314,000.00	11,802,700.00
PL1-PL3	02	3,000,000.00	-	-	3,000,000.00
එකතුව	**08**	**9,288,700.00**	**06**	**7,314,000.00**	**16,602,700.00**

ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග

කොවිඩ් වසංගත රෝගය ව්‍යාප්ත වීම හේතුවෙන් මෙම ආයතනයේ මූල්‍ය තත්වය අයහපත් වුවද, අඛන්ඩව සේවයට වාර්තා කිරීමට නොහැකි වුවද, දිස්ත්‍රික් කාර්යාල වලින් එවනු ලැබූ අඩුපාඩු සහිත වූ ණය ලිපිගොනු පරීක්ෂාකර අදාල දිස්ත්‍රික් කාර්යාල වල විෂයභාර නිලධාරීන් දැනුවත් කර එම අඩුපාඩු සම්පූර්ණ කරවා ප්‍රමාදයකින් තොරව අනුමැතියට යොමුකිරීමට කටයුතු කිරීම හා ණය මුදල් ගෙවීම් කිරීමට අදාල අනෙකුත් කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම.

ඉලක්ක කරා ළඟාවීමේදී මුහුනපෑමට සිදුවූ ගැටළු


කොවිඩ් වසංගත රෝගය ව්‍යාප්ත වීම හේතුවෙන් මෙම ආයතනයේ පැවති අයහපත් මූල්‍ය තත්වය මත 2021 වර්ෂයේ මාණ්ඩලික නිවාස ණය ලබාදීම පහත වැටීම.

මාණ්ඩලික නිවාස ණය විෂයට අදාල ලිපිගොනු/ ලිපි වෙනත් අංශ වෙත යැවීමේදී කාර්යාල සහයක වරයකු නොමැති වීම හේතුවෙන් විවිධ අපහසුතාවයන්ට පත්වීම.


විනය අංශය

ආයතනික සේවා ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය පවත්වා ගැනීම සඳහා මානව සම්පත විධිමත්ව කළමනාකරණය කරගත යුතුයි. විධිමත් අධ්‍යාපනික හැකියාවන්, දක්ෂතාවයන් සහිතවූ පිරිසක් මෙන්ම පහළ මට්ටමේ අධ්‍යාපනය සමත් ප්‍රවේශයක් සහිත පිරිසක් ද ආයතනය තුළ සිටීම සාමාන්‍ය තත්ත්වයකි. එහිදී රාජකාරිමය කටයුතු ඉටුකිරීමේදී ආයතනික නීති - රීති, රෙගුලාසි, වලට අවනත නිසා සිදුවන වැරදි මඟහරවා ගැනීම හා සිදුකරන වැරදි සඳහා දඬුවම් පැනවීම විනය අංශය මඟින් සිදුකරනු ලබයි.

විනය කටයුතු අංශයේ 2021 වර්ෂය තුළ ක්‍රියාත්මත වූ බරපතල විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධ සංඛ්‍යාත්මක විස්තර



විනය කටයුතු අංශයේ 2021 වර්ෂය තුළ ක්‍රියාත්මත වූ සුළු විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධ සංඛ්‍යාත්මක විස්තර



මේ වන විට වැඩ තහනම් නිලධාරින්/ සේවකයින් සංඛ්‍යා 20කි. 2021 වර්ෂය තුළ විධිමත් විනය පරීක්ෂණ 3 ක් පැවති අතර ඉන් පරීක්ෂණ 01ක් සඳහා විනය නියෝග නිකුත් ඇත. 2021.01.01 දින සිට 2021.12.31 දක්වා අවසන් කිරීමට නොහැකි වූ විධිමත් විනය පරීක්ෂණ ගණන 04 කි. විනය පරීක්ෂණය වලට අගතියක් නොවන පරිදි 03 දෙනෙකු සේවය පිහිටුවා ඇත.

2021 වසරේ දී පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත එල්ල වූ බාධාවන් මධ්‍යයේ වුවද අධිකරණ/ කම්කරු විනිශ්ච සභා හා මානව හිමිකම් කොමිෂන් සභාව යන ආයතනවල විභාග වූ නඩුවලට අදාළ කරුණු ඉදිරිපත් කිරීම් හා සාක්ෂි ඉදිරිපත් කිරීම් මෙම අංශයෙන් සිදුකර ඇත.

විධිමත් විනය පරීක්ෂණ අවසානයේ දී ලැබෙන පරීක්ෂණ නිලධාරි වාර්තාවන් සම්බන්ධව තීරණ ගැනීම සඳහා සේවක විනය සමාලෝචන කමිටුව මගින් අවශ්‍ය තීරණ ලබා දී අධ්‍යක්ෂ මණ්ඩල වෙත යොමුකර ලැබෙන තීරණ ක්‍රියාත්මක කිරීම සිදුකර ඇත.

- 2021වර්ෂය තුළදී පහත සඳහන් බාධාවන් හා අභියෝගයන්ට මෙම අංශයට මුහුණදීමට සිදුවිය,
- කොවිඩ් 19 වසංගතය පැතිරයාම හේතුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පැමිණිමට බාධා ඇතිවිම.
- විගණන හා විමර්ශන වාර්තා වල පැවති දුර්වලතාවයන් හේතු කොට ගෙන චෝදනා පත්‍ර සකස් කිරීමේදී මෙන්ම විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමේදී ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු විම.

ඉහතින් සඳහන් කල දුර්වලතාවයන් මඟහරවා ගැනීමට හා මෙම අංශයේ කටයුතු වඩා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

- ආයතනයේ විනය කටයුතු සම්බන්ධයෙන් හා අධිකාරියේ පවතින නීතිරීති/ චක්‍රලේඛ හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- වාර්ෂික හෝ අර්ධ වාර්ෂිකව අධිකාරියේ පරිපාලනය හා ක්‍රියාකාරිත්වය පිළිබඳව සියළුම සේවකයින්ගේ මත විමසිමක්/ අදහස් විමසීමක් සිදු කිරීම.
- විනය විරෝධී ක්‍රියාවක් සිදුවූ පසු දඬුවම් ලබාදීමට වඩා වංචා හා වැරදි වැලක්වීමේ ක්‍රියාමාර්ගයන් ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීම.
- විනය විරෝධී සිද්ධීන් සම්බන්ධයෙන් සිදුකරනු ලබන විගණන හා විමර්ශන අවසානයේදී සම්පූර්ණ කරුණු සහිත වාර්තා ඉදිරිපත් කරවීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

ආයතනයේ අරමුණු කරා ළඟාවීමේදී ඉහත සඳහන් කරුණු පිළිබඳව මීට වඩා සැළකිල්ලක් දක්වීම තුළින් හා සේවක පිරිසගේ පුද්ගල සංවර්ධනය සිදුවන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම තුළින් විනය ගරුක සේවක පිරිසක් බිහි කිරීමට හැකියාවක් ඇති බව ඔබගේ දැන ගැනීම සඳහා කාරුණික ඉදිරිපත් කරමි.

ආරක්ෂක අංශය

ආරක්ෂක අංශයේ නිලධාරින් සිමිත සංඛ්‍යාවක් සිටින බැවින් ආයතනය සතු චංචල / නිශ්චල දේපල හා සම්පත් ආරක්ෂා කිරීම, ආයතනයේ කීර්තිනාමය හා සේවක විනය ආරක්ෂා කිරීමත් එහි කටයුතු කළමනාකරණය කරගනිමින් ආරක්ෂක කටයුතු නිසියාකාරව කිරීම ආරක්ෂක අංශයෙහි කාර්යය භාරයකි. ඒ අනුව ආරක්ෂක අංශය ඉලක්ක සපුරා ගැනීමට අදාල විස්තර පහත දැක්වේ.

සම්පාදනය කල ඉලක්ක:

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරක්ෂක අංශය, අධිකාරිය සතු චංචල/ නිශ්චල දේපල හා මානව සම්පත් ආරක්ෂා කිරීම, ආයතනික කීර්තිනාමය හා සේවක විනය ආරක්ෂා කිරීම සඳහා පූර්ණ ශක්තිය හා ක්‍රමවේදයන් යොදා කටයුතු කරනු ලැබීය.
- 2020 මාර්තු මස සිට රටපුරා පැවති කොවිඩ් 19 උවදුර හේතුවෙන් ආරක්ෂක පුරප්පාඩු පැවතියද අඛණ්ඩව ආරක්ෂක කටයුතු පවත්වාගෙන යන ලදී.
- 2021 ජනවාරි මස වනවිට ආරක්ෂක කාර්යය මණ්ඩලය 24 දක්වා අඩු වූ අතර තත්ත්වය එසේ තිබියදිත්, ආරක්ෂක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුවිය.
- ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සේවා ස්ථාන කිපයක් සඳහා ආරක්ෂක නිලධාරින් විවිධ ක්‍රම උපායන් යොදා ආරක්ෂාව තහවුරු කර ගැනීමට සිදුවිය.
- එසේ ආරක්ෂක නිළධාරින් යෙදවූ සේවා ස්ථාන මෙසේය.
    - ජල්තර රජයේ සේවක නිවාස ව්‍යාපෘතිය
    - මිහිඳු පුර නිවාස යෝජනා ක්‍රමය

ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල සහ මුහුණ දීමට සිදුවූ ගැටළු

- ප්‍රධාන කාර්යාලය හා නිවාස මහ ලේකම් කාර්යාල ගෙඩනැගිල්ලේ පිහිටි කාර්යාල සඳහා පැමිණෙන වාහන/ පුද්ගලයින්, ගමන්මලු ආදීය පරීක්ෂාවට ලක් කිරීම හා අදාල අංශ වෙත යොමු කිරීම.
- ආරක්ෂක නිලධාරින් වෙත උපදෙස් පංති පැවැත්වීම, දිස්ත්‍රික් කාර්යාල හා සියළුම සේවා ස්ථාන සඳහා අවශ්‍ය රාජකාරී උපදෙස් ලිඛිතව නිකුත් කිරීම, එකී උපදෙස් සම්බන්ධව අංශ ප්‍රධානීන් හා දිස්ත්‍රික් කළමනාකරුවන් දැණුවත් කිරීම, ආරක්ෂක නිලධාරින් සතු වගකීම් හා කාර්ය භාරය සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම හා දැනට අනුමත පුද්ගලික ආරක්ෂක සේවා යොදාගෙන ඇති දිස්ත්‍රික් කාර්යාලවල ආරක්ෂක කටයුතු පවත්වාගෙන හා අධීක්ෂණය සම්බන්ධයෙන් එම කාර්යාල වල පාලන අංශය දැනුවත් කිරීම.
- සේවක/ සේවිකාවන්ගේ රාජකාරී පැමිණීම හා පිටවීම සම්බන්ධව සටහන් පවත්වාගෙන යාම හා වේලා සටහන් යන්ත්‍ර ආරක්ෂාව සඳහා පියවර ගැනීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කීර්තිනාමයට හානිකර කටයුතු වැලැක්වීම හා වංචනික ක්‍රියා හා අලාභ කිරීමේ චේතනාවෙන් කෙරෙන ක්‍රියාවන් සොයා බලා වාර්තා කිරීම හා විනය පවත්වාගෙන යාමට සහායවීම.

- කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය මුලිකව පවත්වාගෙන යනු ලබන අධි ආරකෂිත කලාපයෙහි පිහිටි ආයතන, ආරක්ෂක කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා එහිදී ගනු ලබන තීරණ හා උපදෙස් පරිදි කටයුතු කිරීම, ඒ සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම.

- පාලන අධිකාරියේ තිරණ මත සේවා ස්ථාන සඳහා ආරක්ෂක පිරිස් යෙදවීම. අවම මට්ටමක පවත්වාගෙන යාම. අතිකාල අවම කර ගැනීමට කටයුතු කිරීම හා ඒ තුළින් අධිකාරියේ මුල්‍ය තත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කලත් පවතින ආරක්ෂක පිරිසගේ ඌණතාවය හේතුවෙන් එය පාලනය කිරීම අපහසු වී ඇත.

- නිවාස මහලේකම් ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා ගිණි අවි සන්නද්ධ ආරක්ෂක පිරිස් යෙදවීම.

- හදිසි ගිණි ආපදාවකදී මුහුණදීම සඳහා අවශ්‍ය අධි බල ගිණි නිවාරණ ජල නල පද්ධතියක අවශ්‍යතාවය නැවත නැවත අවධාරණය කරන අතර, එය ක්‍රියාත්මක කර ගැනීම සඳහා නැවතත් ඉල්ලීම් ඉදිරිපත් කලත් 2021 වර්ෂයේ දී ද ක්‍රියාත්මක නොවිය. තවද දැනට ගොඩනැගිල්ලේ සවිකර ඇති විදුලි සෝපාන යන්ත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් ද සොයා බැලීම වැදගත් වන අතර දැනට අළුතින් විදුලි සෝපාන දෙකක් සවිකිරීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවති.

- ආරක්ෂක කටයුතු පහසු කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම යොදා ගැනීම සුදුසු බැවින් CCTV කැමරා පද්ධතියක් කාර්යාල පරිශ්‍රයේ සවිකිරීම සිදුකර කර ඇති අතර, ආරක්ෂක කටයුතු වලදී එය ඉතා වැදගත් වේ.

- අධිකාරණ නියෝග ලබාගත් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ මෙහෙයුම් සඳහා ආරක්ෂක නිලධාරීන් සහභාගි කරවීම හා හිස් බුක්තිය භාරගත් නිවාස වලට නැවත ඇතුලවීම වැලැක්වීම සඳහා අවශ්‍ය ආරක්ෂක කටයුතු සංවිධානය හා ක්‍රියාවට නැංවීම මූලික විමර්ශන වාර්තා සැකසීම.

- ප්‍රධාන කාර්යාලය ඇතුළු සේවා ස්ථාන 03 ක ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන පැය 24 ම ආවරණය වන පරිදි සේවයේ යෙදවීමට ප්‍රමාණවත් ආරක්ෂක පිරිසක් නොමැතිවීම නිසාත්, සේවා අවශ්‍යතාවය මත අතිකාල සේවයේ යෙදවීමට සිදුවීම. හිමි නිවාඩු ලබාගැනීම ඉතා අසිරු ලෙස පාලනය කිරීම.

- කාන්තා ආරක්ෂක නිලධාරිණි පුරප්පාඩු 05ක් පැවැතියද, ඒවා සම්පූර්ණ නොකිරීම නිසා, ආරක්ෂක තත්ත්වය පවත්වාගෙන යාමේදී ගැටළු සහගත තත්ත්වයක් මතු වී තිබූ අතර 2019 අප්‍රේල් මස සිට කාන්තා ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය ලැබී ඇත.

- සමස්ථ ආරක්ෂක පිරිසගෙන් සුළු පිරිසක් පුරුද්දක් වශයෙන් සෑම වසරකම වැටුප් රහිත නිවාඩු වැඩි ප්‍රමාණයක් ලබා ගන්නා බැවින්, ඒ සම්බන්ධව පාලන අංශය වෙත යොමු කලද වැටුප් රහිත නිවාඩු සේ සැලකීම හැර වෙනත් ක්‍රියා මාර්ගයක් නොගැනීම.

- යෝජනා කල අධිබල ගිනි නිවාරණ පද්ධතිය 2021 වසරේදීත් ක්‍රියාත්මක නොකිරීම.

පුස්තකාලය

අප අධිකාරිය සතු පුස්තකාලය තුළින් ද වර්තමානය වන විට ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය තුළින් ද පාඨකයාට අවැසි තොරතුරු ද කඩිනමින් සොයා ගැනීමේ හැකියාව ඇති අතර, මෙම පුස්තකාලය තුල නිවාසීකරණයට සම්බන්ධව විෂයන්ට අදාලව අන්තර්ගත කොට ඇති ප්‍රකාශන අතරෙහි නිවාස, ගොඩනැගිලි හා සම්බන්ධිත ඉදිකිරීම්, ඉංජිනේරු, ගෘහ නිර්මාණ, ප්‍රමාණ සමීක්ෂණ, ඉඩම් මෙන්ම ඒ යටතේ ඇති අනු විෂයන් සඳහා ද එකතුවක් ගොනු කොට ඇත.

එමෙන්ම තොරතුරු එක් රැස් කර ගැනීමේදී පොත-පතට පමණක් සීමා නොවී විවිධ වූ මාතෘකා යටතේ පුවත්පත් කැපුම් එකතුවක් ද පවත්වා ගෙන යනු ලබන අතර තවද අධිකාරියේ ආරම්භය සිට 2019 වසර දක්වා අප අධිකාරිය පිළිබඳ තොරතුරු පළ වූ පුවත්පත් කැපුම් එකතුවක් ද පවත්වා ගෙන යනු ලබයි. මීට අමතරව නීති වාර්තා, පනත් ආදී එකතුවක් ද මෙහි ගබඩා වී ඇත.

පුස්තකාලයෙහි ඇති තොරතුරු හා පොත පත නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නිරත ස්ථීර නිළධාරීන් හා සේවකයන් හට බැහැර ගෙනයාමට අවස්ථාව ලබාදෙන අතර, සෙසු පාඨකයින් හට ද සතියේ දින 05 තුල පුවත්පත් බැලීමට මෙන් ම සිය අවැසි පත-පොතට අයත් විමර්ශන කටයුතු සඳහා පුස්තකාලය විවෘතව පවතී.

මේ වන විටත් වටිනා ග්‍රන්ථ 7000 ක පමණ ආසන්න එකතුවක් සමන්විත අප ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් පුස්තකාලය ප්‍රධාන කාර්යාලයේ 09 වන මහලෙහි ස්ථාපිත කර ඇති අතර එහි නිවාස විෂය ආශ්‍රිත සම්බන්ධිත හා සීමිත වශයෙන් විවිධ විෂයන් යටතේ වූ පොත පත ද අන්තර්ගත වේ.

නීති කොට්ඨාශය

නීති අංශය මගින් සිදුකරනු ලබන කාර්යයන්.

- ඉඩම් හා නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම.
- මහල් නිවාසවල ඔප්පු ලබාදීම සඳහා අවශ්‍ය වන සභාධිපත්‍ය ප්‍රකාශන සකස් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළ දේපළ සම්බන්ධයෙන් පොදුවේ සමාජයට අගතියක් වන පැමිණිලිවලට අදාළව කටයුතු කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්හී දී යම් යම් පුද්ගලයන්ට හා ආයතනවලට එරෙහිව නීති කටයුතු කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් හා නිවාස අනවසරයෙන් භුක්තිවිඳින අයට එරෙහිව නඩු පවරා නිරවුල් සන්තකය ලබාගැනීම.
- බාහිර පාර්ශවයන් හා මෙම අධිකාරිය අතර කටයුතුවලදී කොන්ත්‍රාත් ගිවිසුම් සකස් කිරීම හා අනෙකුත් ගිවිසුම් සකස් කිරීම.
- සියලුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ආවරණය වන පරිදි අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.
- ණය හා කුළී වාරික නොගෙවන හිඟ ණය වාරික හිමියන්ට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනිමින් අධිකාරියට අයවිය යුතු මුදල් ලබාගැනීමට කටයුතු කිරීම.
- නීති නිවේදන හා නෙරපීමේ නියෝග නිකුත් කරමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අයකරීම් සඳහා දායකත්වය ලබාදීම.
- මානව හිමිකම් පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- නීතිපති දෙපාර්තමේන්තුවට ගොනුකර ඇති නඩු සම්බන්ධයෙන් අවශ්‍ය සහාය ලබාදීම.
- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ධූරයට අදාළ රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය නියෝජනය ලබාදීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙනත් කමිටු සඳහා අවශ්‍ය නියෝජනයන් ලබාදීම.
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නම්කළ නිලධාරී තනතුරට අදාළ සියලු රාජකාරී කටයුතු සිදු කිරීම.

සින්නක්කර ඔප්පු නිකුත් කිරීම

2021.01.01 දින සිට 2021.12.31 දිනට ප්‍රගතිය

නීති අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

අනු අංකය	දිස්ත්‍රික්කය	ඔප්පු සංඛ්‍යාව
1	**කොළඹ දිස්ත්‍රික් කාර්යාලය**	**120**
2	**කොළඹ නගර උතුර**	**86**
3	**කොළඹ නගර දකුණ**	**50**
4	**මහනුවර**	**67**
5	**කළුතර**	**44**
6	**කෑගල්ල**	**20**
7	**රත්නපුර**	**9**
8	හම්බන්තොට	**23**
9	**ගම්පහ**	**136**
10	**කුරුණෑගල**	**24**
11	මාතර	**31**
12	**පුත්තලම**	**28**
13	**ගාල්ල**	**75**
14	මොනරාගල	**17**
15	වව්නියාව	**58**
16	**මාතලේ**	**25**
17	මන්නාරම	**1**
18	පොලොන්නරුව	**8**
19	අනුරාධපුර	**15**
20	අම්පාර	**1**
21	බදුල්ල	**9**
22	යාපනය	**1**
23	නුවරඑළිය	**17**
24	මඩකළපුව	**1**
	මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති	
25	මවුන්ට්ක්ලිෆර්ඩ් නිවාස ක්‍රමය	41
26	ග්‍රීන්වැලි නිවාස ක්‍රමය	40
සම්පූර්ණ එකතුව		**947**

විභාග වෙමින් පවතින නඩුවලට අදාළ තොරතුරු

ප්‍රධාන කාර්යාලය
සාරාංශය (2022.02.01 දිනට ප්‍රගතිය)

අනු අංකය	නඩුවේ ස්වභාවය	නඩු සංඛ්‍යාව									එකතුව	අවසන් කර ඇති නඩු ගණන	දැනට විභාග වන නඩුවල එකතුව
		ශ්‍රේෂ්ඨාධිකරණය	මහේස්ත්‍රාත් අධිකරණය	මහාධිකරණය	වාණිජ මහාධිකරණය	දිසා අධිකරණය	අභියාචනාධිකරණය	සිවිල් අභියාචනාධිකරණය	කම්කරු විනිශ්චය සභාව	කාර්මික අධිකරණය			
1	ඉඩම් සම්බන්ධව	4				1	9				14	2	12
2	නිවාස ගැටළු	1		1				1			3	3	0
3	සේවයෙන් පහකිරීමට / සේවය අත්හිටුවීමට එරෙහිව	1		1			2		5	3	12	3	9
4	අර්ථසාධක ගැටළු සම්බන්ධව		1				2				3	1	2
5	ඉදිකිරීම් සම්බන්ධව ගැටළු				1	1	2				4	2	2
6	ස්ථානමාරුවීම් සම්බන්ධව			1			1				2		2
7	හිඟ වැටුප් ගෙවීමට අදාළ ගැටළු								1	1	2		2
8	මුදල් වංචා කිරීම් සම්බන්ධව										0		0
9	සෞඛ්‍යමය ගැටළු සම්බන්ධව		1								1		1
10	ගිවිසුම් කඩකිරීම් සම්බන්ධ ගැටළු	1		2	2	3					8	3	5
11	බදු කුළී ගැටළු												
12	වන්දි ඉල්ලීම් සම්බන්ධව					1			1		2		2
13	අධිකරණයට අපහාස කිරීම සම්බන්ධව						1				1		1
මුළු එකතුව		**7**	**2**	**5**	**3**	**6**	**17**	**1**	**7**	**4**	**52**	14	**38**

නීති කටයුතු තුළින් අයකරගෙන ඇති මුදල් පිළිබඳ වාර්ෂික ප්‍රගති වාර්තාව

නීති අංශය

මාසය - 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

අනු අංකය	දිස්ත්‍රික් කාර්යාලය	පූර්ව නිවේදන		නීති නිවේදන		එන්තරවාසි		ණය පැහැරහැරීම් සම්බන්ධ නඩු				නාගරික කුළී නඩු		අයකර ඇති මුළු මුදල (රුපියල්)
		යොමුකළ සංඛ්‍යාව	අයකර ඇති මුදල (රුපියල්)	යොමු කළ සංඛ්‍යාව	අයකර ඇති මුදල (රුපියල්)	යොමු කළ සංඛ්‍යාව	අයකර ඇති මුදල (රුපියල්)	විසිරි ණය සම්බන්ධව පවරා ඇති නඩු සංඛ්‍යාව	අයකර ඇති මුදල (රුපියල්)	උපහාර ණය සම්බන්ධව පවරා ඇති නඩු සංඛ්‍යාව	අයකර ඇති මුදල (රුපියල්)	නඩු සංඛ්‍යාව	අයකර ඇති මුදල (රුපියල්)	
1	කොළඹ	123	1,101,354.04	7	2,798,587.49	5	3,494,455.64	-	166,045.00	-	1,120,308.00	-	1,535,381.69	10,216,131.86
2	කොළඹ දකුණ	350	927,424.40	300	7,552,145.50	10	5,670.00	15	3,500.00	-	-	21	14,055.00	8,502,794.90
3	කොළඹ උතුර	47	1,061,658.74	-	-	-	-	16	90,000.00	-	-	7	3,000,000.00	4,151,658.74
4	කළුතර	329	992,363.41	1,778	4,417,432.59	146	317,900.00	7	-	3	623,927.00	-	-	6,351,623.00
5	ගම්පහ	10	125,420.00	12	187,540.00	20	187,540.00	-	183,510.00	-	25,400.00	-	2,503,930.00	3,213,340.00
6	කෑගල්ල	284	301,501.00	3	25,000.00	4	105,300.00	2	203,109.00	-	-	-	-	634,910.00
7	මහනුවර	65	203,177.00	29	772,930.13	3	5,000.00	2	457,054.26	5	335,000.00	-	-	1,773,161.39
8	මාතලේ	1,520	226,753.80	775	183,425.00	40	246,720.00	55	83,251.00	1	-	-	-	740,149.80
9	නුවරඑළිය	30	70,300.00	57	145,300.00	74	30,766.00	-	27,500.00	-	489,148.77	-	-	763,014.77
10	බදුල්ල	1,718	1,570,876.00	467	1,352,038.00	2	-	1	8,000.00	-	-	-	-	2,930,914.00
11	රත්නපුර	1,870	3,847,472.09	170	558,002.64	8	299,750.00	-	2,000.00	-	-	-	-	4,707,224.73
12	ගාල්ල	30	287,928.00	17	326,629.00	6	436,762.00	73	628,830.55	9	182,810.00	-	-	1,862,959.55
13	මාතර	-	-	48	24,300.00	-	664,977.00	-	864,451.00	-	1,368,787.00	-	-	2,922,515.00
14	හම්බන්තොට	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
15	මොනරාගල	1,491	1,532,208.37	109	956,742.38	7	-	-	233,954.57	1	-	-	-	2,722,905.32
16	කුරුණෑගල	-	-	8,123	9,469,726.00	116	570,960.00	2	-	-	-	-	-	10,040,686.00
17	පුත්තලම	106	186,075.00	75	285,700.00	25	385,100.00	10	275,150.00	-	-	-	-	1,132,025.00
18	අනුරාධපුර	595	1,478,405.00	229	365,250.00	-	-	-	-	-	-	-	-	1,843,655.00
19	පොලොන්නරුව	1,251	4,168,818.33	541	2,586,442.88	18	811,405.66	2	210,000.00	2	147,901.00	-	90,000.00	8,014,567.87
20	ත්‍රිකුණාමලය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
21	වව්නියාව													-
22	අම්පාර													-
23	මඩකළපුව													-
24	මන්නාරම													-
25	කිළිනොච්චිය													-
26	මුලතිව්													-
27	යාපනය	130	188,274.00	585	881,420.13	12	26,881.62	60	1,742,220.80	3	193,168.95	-	-	3,031,965.50
එකතුව		**9,949**	**18,270,009.18**	**13,325**	**32,888,611.74**	**496**	**7,589,187.92**	**245**	**5,178,576.18**	**24**	**4,486,450.72**	**28**	**7,143,366.69**	**75,556,202.43**

දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් පවරා ඇති නඩුවලට අදාළ තොරතුරු

දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් පවරා ඇති නඩුවලට අදාළ තොරතුරු (මේ වන විට ක්‍රියාත්මක වන නඩු)

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

අනු අංකය	දිස්ත්‍රික් කාර්යාලය	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පවරා ඇති නඩු පිළිබඳ තොරතුරු										ජාතික නිවාස සංවර්ධන අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳ තොරතුරු					සම්පූර්ණ නඩු සංඛ්‍යාව
		ණය පැහැරහැරීම් සම්බන්ධ නඩු සංඛ්‍යාව (මුදල් නඩු)		නාගරික කුළී නඩු සංඛ්‍යාව	අනවසර ඉඩම් / නිවාස / ගොඩනැගිලිවල සන්තකය ආපසු ලබාගැනීම	වෙනත් නඩු සංඛ්‍යාව (කම්කරු විනිශ්චය සභාව, මහාධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය)	එකතුව	අයවිය යුතු මුදල	නීති කටයුතු තුළින් මුදල් අයකර ඇති නඩු සංඛ්‍යාව	නීති කටයුතු තුළින් අය වී ඇති මුදල	අයවිය යුතු ඉතිරි මුදල	නඩු සංඛ්‍යාවේ එකතුව				වන්දි මුදලක් ඉල්ලා ඇත්නම් එම වන්දි මුදලේ ප්‍රමාණය	
		උපහාර	විසිරි									වන්දි මුදලක් ඉල්ලා පවරා ඇති නඩු	වෙනත් නඩු	කොන්ත්‍රාත් LT නඩු	එකතුව		
1	කොළඹ	82	87	5	20	12	**206**	76,951,223.70	115	14,682,977.77	60,250,685.93	-	1	2	**3**	-	**209**
2	කොළඹ දකුණ	-	15	21	14	1	**51**	3,934,259.78	2	306,921.47	3,627,338.31	1	16	-	**17**	2,000,000.00	**68**
3	කොළඹ උතුර	-	16	7	1	1	**25**	64,470,440.00	4	5,592,376.00	58,878,064.00	1	2	-	**3**	600,000.00	**28**
4	කළුතර	3	7	-	2	-	**12**	2,636,630.39	3	623,927.00	2,012,703.39	1	1	1	**3**	25,000,000.00	**15**
5	ගම්පහ	35	119	1	2	6	**163**	18,000,000.00	25	3,000,000.00	15,000,000.00	-	-	6	**6**	-	**169**
6	කෑගල්ල	-	91	-	-	-	**91**	2,223,083.00	22	430,502.00	1,792,581.00	-	-	-	**-**	-	**91**
7	මහනුවර	24	96	-	2	-	**122**	7,668,569.63	39	792,054.26	6,876,515.37	1	9	17	**27**	10,000,000.00	**149**
8	මාතලේ	1	55	-	-	-	**56**	856,721.26	55	243,257.00	613,464.26	-	-	10	**10**	-	**66**
9	නුවරඑළිය	-	-	-	-	-	**-**	-	-	-	-	-	-	21	**21**	-	**21**
10	බදුල්ල	1	1	-	-	1	**3**	354,182.00	2	131,762.00	222,420.00	1	2	17	**20**	1,000,000.00	**23**
11	රත්නපුර	-	1	-	3	-	**4**	114,971.59	1	2,000.00	112,971.59	-	-	3	**3**	-	**7**
12	ගාල්ල	9	73	-	-	1	**83**	78,886,051.00	12	811,640.55	78,074,410.45	-	2	-	**2**	-	**85**
13	මාතර	22	374	-	5	2	**403**	34,641,452.87	335	30,491,134.81	4,150,318.06	-	-	720	**720**	-	**1,123**
14	හම්බන්තොට	-	33	-	-	-	**33**	929,766.50	2	31,000.00	898,766.50	1	-	-	**1**	501,000.00	**34**
15	මොනරාගල	1	4	-	4	-	**9**	619,188.64	4	233,954.57	385,234.07	-	1	-	**1**	-	**10**
16	කුරුණෑගල	-	28	-	1	-	**29**	1,256,753.14	11	289,287.80	967,465.34	-	4	-	**4**	-	**33**
17	පුත්තලම	-	10	-	3	-	**13**	1,075,200.00	2	275,150.00	800,050.00	3	1	-	**4**	660,000.00	**17**
18	අනුරාධපුර	-	-	-	-	-	**-**	-	-	-	-	-	-	16	**16**	-	**16**
19	පොලොන්නරුව	2	2	-	-	-	**4**	447,686.30	4	348,901.00	98,785.30	-	-	-	**-**	-	**4**
20	ත්‍රිකුණාමලය	-	-	-	-	-	**-**	-	-	-	-	-	-	-	**-**	-	**-**
21	වවුනියාව	-	-	-	-	-	**-**	-	-	-	-	-	-		**-**	-	**-**
22	අම්පාර	-	-	-	-	-	**-**	-	-	-	-	-	-	37	**37**	-	**37**
23	මඩකළපුව	-	-	-	-	-	**-**	-	-	-	-	-	-	-	**-**	-	**-**
24	මන්නාරම	-	-	-	-	-	**-**	-	-	-	-	-	-	-	**-**	-	**-**
25	කිළිනොච්චිය	-	-	-	-	-	**-**	-	-	-	-	-	-	-	**-**	-	**-**
26	මුලතිව්	-	-	-	-	-	**-**	-	-	-	-	-	-	-	**-**	-	**-**
27	යාපනය	3	60	-	-	-	**63**	5,518,598.55	56	1,876,475.80	3,642,122.75	-	-	-	**-**	-	**63**
එකතුව		**183**	**1,072**	**34**	**57**	**24**	**1,370**	**300,584,778.35**	**694**	**60,163,322.03**	**238,403,896.32**	**9**	**39**	**850**	**898**	**39,761,000.00**	**2,268**

උපහාර ණය අයකිරීම සඳහා ගෙන ඇති නීතිමය පියවර

2021.12.31 දිනට ප්‍රගතිය

අනු අංකය	දිස්ත්‍රික් කාර්යාලය	නඩු සංඛ්‍යාව	අවසන්ව ඇති නඩු සංඛ්‍යාව	අධිකරණ නියෝගය අනුව අයකරගැනීමට නියමිත මුළු මුදල	දැනට අයකරගෙන ඇති මුදල	අයකර ගැනීමට නියමිත ඉතිරි මුදල
1	කොළඹ	82	2	44,656,824.04	9,219,002.30	35,437,821.73
2	කොළඹ දකුණ	-		-	-	-
3	කොළඹ උතුර	-		-	-	-
4	කළුතර	3		1,647,382.18	623,927.00	1,237,066.43
5	ගම්පහ	35		8,660,955.00	450,500.00	8,210,455.00
6	කෑගල්ල	-		-	-	-
7	මහනුවර	24		7,854,201.76	335,000.00	7,519,201.76
8	මාතලේ	1	1	55,935.00	55,935.00	-
9	නුවරඑළිය	2		1,073,015.12	489,148.77	583,866.35
10	බදුල්ල	2	1	421,121.00	234,734.00	186,387.00
11	රත්නපුර	-		-	-	-
12	ගාල්ල	9	7	3,516,580.34	1,982,848.92	1,700,665.82
13	මාතර	25	3	12,062,454.79	5,177,365.52	6,885,089.27
14	මොනරාගල	1	1	293,900.00	-	293,900.00
15	කුරුණෑගල	-		-	-	-
16	පොලොන්නරුව	2	1	237,686.30	138,901.00	98,785.30
17	පුත්තලම	-		-	-	-
18	කිළිනොච්චිය	-		-	-	-
19	යාපනය	3	1	193,168.95	134,255.00	58,913.95
20	අනුරාධපුරය	-		-	-	-
21	ත්‍රිකුණාමලය					
22	හම්බන්තොට					
23	වව්නියාව					
24	අම්පාර	-		-	-	-
25	මඩකළපුව					
26	මන්නාරම					
27	මුලතිව්	-		-	-	-
එකතුව		**189**	**17**	**80,673,224.48**	**18,841,617.51**	**62,212,152.61**

සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය

තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගනිමින් පවත්නා රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව ඉදිරි පස් අවුරුදු කාල සීමාව තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අරමුණු හා අරමුණු ඉටුකර ගැනීම සඳහා අනුගමනය කිරීමට බලාපොරොත්තු වන උපාය මාර්ග සැලසුම් හා ඉලක්ක ඇතුලත් සංයුක්ත සැලැස්ම සැකසීම, මධ්‍යකාලීන සැලැස්ම අනුව වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් වලට අදාල භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමත්, වර්ෂය ආරම්භ වීමට පෙර සිදුකරනු ලබයි.

ප්‍රගති සමාලෝචනය හා මෙහෙයවීම

සකස් කළ ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් හා ඉලක්ක දිස්ත්‍රික් කාර්යාල මඟින් ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සෑම මාසයක් අනසානයේම ලබාගෙන ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය හා ඉලක්ක සපුරා නොගත් අවස්ථා පිළිබඳ ඉහළ කළමනාකාරීත්වය වෙත හා අමාත්‍යාංශය, භාණ්ඩාගාරය ඇතුළු භාහිර පාර්ශව වෙත වාර්තා කිරීම මෙම කොට්ඨාසය මඟින් සිදු කරනු ලබයි. එසේම වර්ෂය තුල ආයතනයේ ක්‍රියාකාරීත්වය, ඉටුකළ කාර්යභාරය ඇතුළත් වර්ෂික වාර්තාව සැකසීම, මහ බැංකු වාර්තාව සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ තොරතුරු ලබාදීම. අයවැය විවාද අවස්ථාව සඳහා අවශ්‍ය තොරතුරු පාර්ලිමේන්තුව වෙත ලබාදීම සිදුකරනු ලබයි.

පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා පිළිතුරු

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අසනු ලබන වාචික ප්‍රශ්ණ සඳහා පිළිතුරු සාරාංශ ලබාදීම, පාර්ලිමේන්තු උපදේශක සභාවේදී හා ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම්වලදී පැන නැගෙන ප්‍රශ්ණ වලට පිළිතුරු ලබාදීමත් මෙම කොට්ඨාසය මඟින් කරනු ලබන රාජකාරී අතර වේ.

සෙවණ ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය

සෙවණ ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය පියවර ගැනීම සිදුකරන අතර, සෙවණ අරමුදලට ලැබෙන මුදල් යෙදවීම සම්බන්ධ අනුමැතියන් ලබාගැනීමට සෙවණ පාලක මණ්ඩලය කැඳවීම හා ඒ සඳහා පාලක මණ්ඩල පත්‍රිකා අදාළ කොට්ඨාස වෙතින් ලබාගෙන පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම මෙම කොට්ඨාසය මඟින් සිදුකෙරේ. 2021 වර්ෂය තුල රටෙහි පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සෙවණ පාලක මණ්ඩල රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා ඇති අතර, දුගී දුප්පත් පවුල් 02 සඳහා සෙවණ අරමුදල් යටතේ නිවාස අවශ්‍යතාවය සපුරා තිබේ. ලොතරැයි අලෙවියෙන් රු.මි.31.513 ක මුදලක් සෙවණ අරමුදල වෙත බැරකර ඇත.

ව්‍යාපෘති යෝජනා

ඉදිරි වර්ෂ සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම සඳහා වැඩසටහන් ඇස්තමේන්තු හා ව්‍යාපෘති යෝජනා සකස් කර සැලසුම් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම මෙම කොට්ඨාසය මඟින් සිදුකරනු ලබන රාජකාරී අතර වේ. ඒ අනුව 2021 වර්ෂය තුල සංවර්ධන කටයුතු සඳහා භාණ්ඩාගාර අරමුදල් රු.මි.8229.290 ලබා ගැනීමට හැකිවිය. මෙම අරමුදල් මඟින් අඩු ආදයම්ලාභී නිවාස ආධාර වැඩසටහන සඳහා ප්‍රමුඛතාව දී තිබීමද විශේෂත්වයකි. එසේම සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් නව නිවාස හා වැඩිදියුණු නිවාස වැඩසටහන වෙනුවෙන් ණය ලබාදීම සඳහාද යොදාගෙන ඇත.

1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය

මීට අමතරව 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍ර සඳහා ආයතනයට අදාළ තොරතුරු ලබාදෙමින් එම තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය මෙම කොට්ඨාසය මඟින් ඉටුකරන රාජකාරී අතර වේ.

ජනතාවගේ තොරතුරු ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීම

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් කටයුතු හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ශ්‍රී ලාංකීය ප්‍රජාව විසින් විමසනු ලබන තොරතුරු ලබාදීමේ තොරතුරු නිලධාරී ලෙස සැලසුම් හා ප්‍රගති කොට්ඨාසයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කටයුතු කරන ලබයි. ඒ අනුව 2021 වර්ෂය තුළ මහජන ඉල්ලීම් හා ඒ සඳහා කටයුතු කළ ආකාරය පහත පරිදි වේ.

2021 වර්ෂය

මුළු ඉල්ලීම් ගණන	-	36
පිළිතුරු ලබාදුන් ගණන	-	31
අභියාචනා සඳහා ඉදිරිපත් කළ ගණන	-	01

සංචාරක බංගලා වෙන් කිරීම හා පරිපාලන කටයුතු

සේවක සුභ සාධනය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු සංචාරක බංගලා 14 ක් පවතින අතර, මේ වන විට ක්‍රියාත්මක තත්වයේ සංචාරක බංගලා 9 ක් පවතී. සංචාරක බංගලාව අයත් දිස්ත්‍රික් කාර්යාල මඟින් ඒවායේ සෘජු අධීක්ෂණය හා පරිපාලන කටයුතු සිදුකරන අතර, සංචාරක බංගලා වෙන්කිරීම හා ඒවාට අවශ්‍ය පහසුකම් සැපයීම සම්බන්ධ කටයුතු සැලසුම් හා ප්‍රගති කොට්ඨාසය මගින් සිදුකරනු ලබයි.

ඊට අමතරව කොළඹ නගර කාර්යාලය මගින් පරිපාලනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිකරන ලද නිවාස ක්‍රමවල ජීවත්වන ප්‍රජාවගේ විශේෂ උත්සව අවස්ථා සඳහා සහනදායී මිලට ලබාදීම සඳහා ප්‍රදීපා ශාලා 04ක් පවත්වාගෙන යනු ලබයි.

'ඔබට ගෙයක් - රටට හෙටක්' නිවාස සංවර්ධන වැඩසටහන - 2021.12.31 දිනට කාර්යය සාධනය

	නිවාස වැඩසටහන	වාර්ෂික ඉලක්ක		ලගාවීම	
		භෞතික ඒකක	මූල්‍ය (රු.මි.)	භෞතික ඒකක	මූල්‍ය (රු.මි.)
භාණ්ඩාගාර ප්‍රතිපාදන					
1	අඩු ආදායම්ලාභී නිවාස වැඩසටහන				
	i "ඔබට ගෙයක් රටට හෙටක්" - ආධාර	12,022	5,705.500	12,231	4,729.400
	ii මිහිදු නිවහන - ආධාර	2,000	750.000	758	196.190
	iii"ඔබට ගෙයක් රටට හෙටක්" - ණය	4,425	1,428.000	5,739	1,544.930
අවිච්ඡේද වැඩසටහන					
2	i "ඔබට ගෙයක් රටට හෙටක්" - ආධාර	6,023	1,206.140	6,023	1,195.640
	ii විරු සුමිතුරු -ආධාර	400	150.000	529	210.200
	iii පාස්කු ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා නිවාස -ආධාර	115	178.360	88	73.408
	iv "ඔබට ගෙයක් රටට හෙටක්" - ණය (අවිච්ඡේද)	1,352		1,352	
	v ආදර්ශ ගම්මාන - 2019 (අවිච්ඡේද)	480	72.000	402	55.074
	උප එකතුව	**26,817**	**9,490.000**	**27,122**	**8,004.842**

	නිවාස වැඩසටහන	වාර්ෂික ඉලක්ක		ලගාවීම	
		භෞතික ඒකක	මූල්‍ය (රු.මි.)	භෞතික ඒකක	මූල්‍ය (රු.මි.)
බාහිර අරමුදල්					
3	සෘජු ඉදිකිරීම්				
	3.1 සපිරි මහල් නිවාස				
	i තංගල්ල නිවාස ව්‍යාපෘතිය (හම්බන්තොට) නිම කිරීම	30			22.973
	ii සොයිසාපුර නිවාස ව්‍යාපෘතිය (මොරටුව)	30			50.200
	iii වැරැල්ලවත්ත නිවාස ව්‍යාපෘතිය (ගම්පහ)	154			
	3.2 රාජ්‍ය පෞද්ගලික දායකත්ව නිවාස (අවිච්ඡේද)				
	i සියනෑ නේචර් පාර්ක් (යක්කල)	43			
	ii රීජන්සි පාර්ක් (කුණ්ඩසාලේ)	32			
අභ්‍යන්තර උත්පාදන					
4	"ඔබට ගෙයක් රටට හෙටක්" - ණය (නව)	1,700	500.000	2,019	467.840
5	"ඔබට ගෙයක් රටට හෙටක්" - ණය (අවිච්ඡේද)	426	46.780	357	46.515
6	**සෙවණ ආධාර නිවාස (නව)**	250	187.500		
7	**ඉන්දියානු ආධාර නිවාස**				
	i ග්‍රාම ශක්ති - 2017 (දිවයින පුරා)	344	45.620	84	23.875
	ii ග්‍රාම ශක්ති - 2017 (දකුණු පළාත)	586	139.850	26	34.420
	iii ග්‍රාම ශක්ති - 2019 (උතුරු පළාත)	580	228.300	38	32.650
	iv ග්‍රාම ශක්ති - 2019 (දකුණු පළාත)	599	255.700		21.300
	උප එකතුව	**4,699**	**1,403.750**	**2,524**	**626.600**
නිවාස ආශ්‍රිත සහායක සේවා					
8	පැරණි නිවාස ක්‍රම නවීකරණය (නගමුපුරවර)		100.000		100.000
9	ඉඩම් වන්දි		10.000		10.000
10	හික්කඩුව ධීවර නිවාස ව්‍යාපෘතිය		39.010		39.001
	උප එකතුව	**31,516**	**11,042.760**	**29,646**	**8,780.443**
11	හිමිකම් ඔප්පු නිකුත් කිරීම	1,000		947	

සැපයුම් අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සැපයුම් අංශය මගින්, ආයතනයේ නොයෙකුත් අංශ හා දිස්ත්‍රික් කාර්යාල වලට අවශ්‍ය කරන සියලුම ක්‍රියාවලීන් ඇතුළුව භාණ්ඩ හා සේවා ගලායාම කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. ඒ සඳහා අපගේ වාර්ෂික ලියාපදිංචි සැපයුම් කරුවන් මෙන්ම විවෘත වෙළඳපොලේ ස්ථාපිත කර ඇති ආයතන/ සමාගම් අතර අන්තර් සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.

2021 වර්ෂය තුල ලැබී ඇති භාණ්ඩ හා සේවා සැපයීමේ ඉල්ලීම් 1142 කි.

ඉන් පහත දැක්වෙන කාණ්ඩ යටතේ භාණ්ඩ හා සේවා සැපයීම සිදු කර ඇති අතර, වැය කරන ලද මුදල් පහත පරිදි වේ.

1. මිළ කැඳවීම් සිදු කරන ලද භාණ්ඩ හා සේවා පහත පරිදි වර්ග කර ඒ සඳහා වැය වූ මුදල

- පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා - රු. 447,040. 80
- නඩත්තු ද්‍රව්‍ය හා උපාංග මිළදී ගැනීම සඳහා - රු. 6,214,637.88
- තේ සලාක හා නිළ ඇඳුම් මිළදී ගැනීම සඳහා - රු. 897,551.75
- ලිපද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා - රු. 4,575,625.03
- විදුලි උපකරණ හා උපාංග සඳහා - රු. 3,107,267.91
- ටෝනර්/රිබන්/කාට්‍රිජ් මිළදී ගැනීම සඳහා - රු. 2,611,405.40
- බැටරි/ටයර් හා අමතර කොටස් මිළදී ගැනීම සඳහා- රු. 2.035,900.30
- යන්ත්‍ර හා උපාංග මිළදී ගැනීම සඳහා - රු. 5,238,703.75
- කාර්යාලයීය භාණ්ඩ හා උපකරණ මිළදී ගැනීම සඳහා - රු. 605,713.23

2. සංග්‍රහ වියදම් වෙනුවෙන් සපයන ආහාර පාන මිළදී ගැනීම වෙනුවෙන් වැය වූ මුදල රු. 647,555.64 කි.
3. අත්තිකාරම් මගින් සිදු කරනු ලබන මිළදී ගැනීම් වෙනුවෙන් වැය වූ මුදල රු. 258,106.50 කි.
4. සුළු මුදලින් කරනු ලබන මිළදී ගැනීම් වෙනුවෙන් වැය වූ මුදල රු. 375,101.41 කි.

ඉලක්ක කරා ළඟාවීමේදී මුහුණ පෑමට සිදු වූ ගැටළු

- කාර්ය මණ්ඩලය වරින් වර බන්ධනය කරමින් සේවයට කැඳවීම නිසා මිළදී ගැනීමේ නිර්දේශ ලබාදීමේ කමිටු නිළධාරීන් කැඳවීමේ අපහසුතා පැවතීම.
- වෙළඳපොල භාණ්ඩ හිඟකම හේතුවෙන් භාණ්ඩ සැපයීමට ප්‍රමාද වීම
- සේවකයන්ට පරිගණක පළපුරුද්ද නොමැතිකම නිසා නියමිත වේලාවට ලිපි නිකුත් කිරීමේ ප්‍රමාදය පැවතීම

අභ්‍යන්තර විගණක කොට්ඨාශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරම්භයේ සිට අභ්‍යන්තර විගණන අංශය පවතින අතර පසුකාලීනව එයට විමර්ශන අංශය ද ඒකාබද්ධ කර ඇත. මෙම අංශය වාර්ෂික විගණන සැලැස්මක් මත කටයුතු කරනු ලබන අතර ඊට අමතරව පැවරෙන විශේෂ රාජකාරි සහ විමර්ශන කටයුතු සිදු කරනු ලබයි. එහි ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- කළමනාකරණය විසින් හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවල පවත්නා ප්‍රමාණාත්මක බව හා ඵලදායකත්වය සම්බන්ධයෙන් ස්වාධීන අඛණ්ඩ ඇගයීමක් පවත්වාගෙන යාම.
- අදාල තොරතුරු සම්පාදනය කිරීමට දායක වෙමින් ඉහළ සහ පහළ කළමනාකාරිත්වය අතර සම්බන්ධීකාරකවරයෙකු වශයෙන් කටයුතු කිරීම.
- දිස්ත්‍රික් ආදායම් මෙහෙයුම් කමිටු හා ප්‍රසම්පාදන කටයුතු වල දී නිරීක්ෂයෙකු වශයෙන් සහභාගි වී කටයුතු කිරීම.
- වාර්ෂික තොග සමීක්ෂණය සියලු දිස්ත්‍රික්ක වලට අදාලව මුදල් සත්‍යාක්ෂණය සිදු කිරීම.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ රැස්වීම් - 03
- නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශයේ රැස්වීම් - 03

2021 වසර තුල වාර්ෂික විගණන සැලැස්ම අනුව පහත කටයුතු මෙම අංශය මඟින් ඉටුකර ඇත.

විගණන විමසුම්

- රජයේ විගණන විමසුම් - 12
- අභ්‍යන්තර විගණන විමසුම් - 30
- රජයේ විගණන අංශය වෙත තොරතුරු ලබා දීම - 10
- විමසුම් නොවන කළමනාකාරීත්වයට ඉදිරිපත් කළ වාර්තා - 08

විමර්ශන කටයුතු පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම

- හදිසි අනතුරු සම්බන්ධයෙන් විමර්ශන කටයුතු - 04
- විෂමාචාර හා විමර්ශන කටයුතු - 15

දේපළ බැහැර කිරීමේ ක්‍රියාකාරීත්වය

- පරීක්ෂා කළ ඔප්පු සංඛ්‍යාව - 700
- පරීක්ෂා කළ 8.1 වගන්ති සංඛ්‍යාව - 2496

වෙනත් රාජ්‍ය ආයතනවල විමසීම් වලට අවශ්‍ය තොරතුරු සැපයීම හා පසු විපරම් කිරීම.

- අමාත්‍යාංශ ලේකම් වෙත තොරතුරු ඉදිරිපත් කිරීම - 01

2022 පාරිතෝෂික දීමනා වලට අදාල ගෙවීම් පරීක්ෂා කිරීම - 91

තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය

සෙවණ මාධ්‍ය ඒකකය


- 2021 වසරේදී සෙවණ මාධ්‍ය සේවය විසින් ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, සී/ස ඕෂන්වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම සහ මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන කඩිනම් වැඩසටහන ඇතුළු ආයතනවල විවිධ පුවත්පත් දැන්වීම් පළකිරීම සිදු කරන ලදී.
- 2021 වසරේදී සෙවණ මාධ්‍ය සේවයෙහි වාර්ෂික ඇස්තමේන්තුගත ලාභය රු. මිලියන 6.0 කි. 2021 දෙසැම්බර් දක්වා ලැබූ ආදායම රු. මිලියන 16.492 ක් වන අතර ලාභය රු. මිලියන 2.292 කි.

- සෙවණ මාධ්‍ය සේවයේ සියලු ඉපැයීම් “සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය” නමින් වූ වෙනම ගිණුමකට බැරකරනු ලබන අතර, මෙම අරමුදල් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා යොදාගනු ලැබේ.

2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආදායම් සහ ලාභ

මාසය	ආදායම රු.	ලාභය රු.
ජනවාරි	611,136.30	85,833.75
පෙබරවාරි	2,281,568.43	320,445.00
මාර්තු	523,729.38	71,859.00
අප්‍රේල්	413,609.70	58,091.25
මැයි	591,952.84	76,574.92
ජූනි	1,210,471.20	170,010.00
ජූලි	1,786,332.60	250,751.25
අගෝස්තු	2,264,137.98	316,317.75
සැප්තැම්බර්	1,978,765.08	276,189.00
ඔක්තෝබර්	1,980,853.44	273,124.50
නොවැම්බර්	1,915,737.06	264,456.75
දෙසැම්බර්	934,187.10	128,748.75
එකතුව	**16,492,481.11**	**2,292,401.92**

2021 වර්ෂය සඳහා ආදායම් ඉලක්කය - රු. මි. 6.0




5. මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

අයකිරීම් ක්‍රියාකාරිත්වය

නිවාස ණය - උපහාර ණය හා විසිරි ණය - 2021

අනු අංකය	දිස්ත්‍රික්කය	උපහාර ණය			විසිරි ණය			සමස්තය		
								උපහාර හා විසිරි ණය		
		ඉලක්ෂිය	ලබාගත්	%	ඉලක්ෂිය	ලබාගත්	%	ඉලක්ෂිය	ලබාගත්	%
1	කොළඹ නගර (උ)				31.836	5.813	18	31.836	5.813	18
2	කොළඹ නගර (දැ)	0.852	0.453	53	30.432	6.797	22	31.284	7.250	23
3	කොළඹ දිස්ත්‍රික්	342.048	185.738	54	376.539	137.558	37	718.587	323.296	45
4	ගම්පහ	159.420	97.114	61	202.608	71.695	35	362.028	168.809	47
5	කලුතර	225.312	127.155	56	252.018	104.041	41	477.330	231.196	48
6	මහනුවර	83.988	61.269	73	252.348	127.971	51	336.336	189.240	56
7	මාතලේ	37.788	32.495	86	157.788	96.206	61	195.576	128.701	66
8	නුවරඑළිය	32.592	25.514	78	179.001	70.242	39	211.593	95.756	45
9	ගාල්ල	78.828	54.681	69	182.472	80.624	44	261.300	135.305	52
10	මාතර	75.876	66.790	88	174.285	85.230	49	250.161	152.020	61
11	හම්බන්තොට	40.980	24.945	61	554.580	230.833	42	595.560	255.778	43
12	කුරුණෑගල	52.212	44.436	85	503.235	178.513	35	555.447	222.949	40
13	පුත්තලම	26.880	20.592	77	207.606	80.603	39	234.486	101.195	43
14	අනුරාධපුරය	44.172	31.826	72	256.749	118.143	46	300.921	149.969	50
15	පොළොන්නරුව	22.272	18.571	83	199.221	77.748	39	221.493	96.319	43
16	බදුල්ල	64.428	28.207	44	201.963	64.847	32	266.391	93.054	35
17	මොණරාගල	53.328	29.609	56	150.486	66.837	44	203.814	96.446	47
18	රත්නපුර	26.544	29.027	109	154.521	80.576	52	181.065	109.603	61
19	කෑගල්ල	57.732	47.147	82	175.470	108.361	62	233.202	155.508	67
20	මඩකලපුව	26.100	16.232	62	119.553	59.220	50	145.653	75.452	52
21	අම්පාර	30.108	17.204	57	216.369	100.657	47	246.477	117.861	48
22	ත්‍රිකුණාමලය	30.432	18.940	62	125.325	69.158	55	155.757	88.098	57
23	යාපනය	19.992	18.528	93	72.084	66.883	93	92.076	85.411	93
24	මන්නාරම	6.444	5.675	88	52.572	32.255	61	59.016	37.930	64
25	වව්නියාව	27.072	23.851	88	46.920	31.415	67	73.992	55.266	75
26	මුලතිව්	16.248	12.906	79	58.215	48.389	83	74.463	61.295	82
27	කිලිනොච්චි	23.892	16.844	71	38.760	32.483	84	62.652	49.327	79
	මුළු එකතුව	1,605.540	1,055.749	66	4,972.956	2,233.098	45	6,578.496	3,288.847	50


ණය අයකිරීම්(රු.මි.) - 2001 සිට 2021 දක්වා
5000
4500
4000
3500
3000
2500
2000
1500
1000
500
0
348.908
396.855
536.970
581.749
607.957
651.077
728.177
870.563
898.775
811.464
1159.882
1731.243
2199.306
2862.922
3488.591
3962.055
4728.067
4486.380
4419.598
3266.008
3288.847
1
2
3
4
5
6
7
8
9
10
11
12
13
14
15
16
17
18
19
20
21

ග්‍රාමීය කුලී/ නාගරික කුලී/ දේපල ආදායම් - 2021

අනු අංකය	දිස්ත්‍රික්කය	ග්‍රාමීයකුලී			නාගරික කුලී			දේපල ආදායම්			එකතුව		
		ඉලක්කය	ලඟාවීම	%	ඉලක්කය	ලඟාවීම	%	ඉලක්කය	ලඟාවීම	%	ඉලක්කය	ලඟාවීම	%
1	කොළඹ නගර (උ)				55.344	33.880	61	13.000	12.715	98	68.344	46.595	68
2	කොළඹ නගර (ද)				50.472	74.036	147	18.500	16.680	90	68.972	90.716	132
3	කොළඹ දිස්ත්‍රික්	0.636	0.033	5	24.180	22.004	91	28.943	13.016	45	53.759	35.053	65
4	ගම්පහ	3.360	0.033	1	48.288	58.678	122	40.626	11.014	27	92.274	69.725	76
5	කලුතර	1.068	0.144	13				3.077	2.563	83	4.145	2.707	65
6	මහනුවර	3.072	0.496	16	13.536	35.563	263	9.700	6.550	68	26.308	42.609	162
7	මාතලේ	0.060	-	-				0.696	0.532	76	0.756	0.532	70
8	නුවරඑළිය	3.192	0.066	2				3.034	0.058	2	6.226	0.124	2
9	ගාල්ල	3.732	0.154	4				2.851	2.709	95	6.583	2.863	43
10	මාතර	0.528	0.127	24	8.616	1.518	18	8.147	8.569	105	17.291	10.214	59
11	හම්බන්තොට	0.936	0.062	7				10.755	0.405	3.77	11.691	0.467	3.99
12	කුරුණෑගල	0.804	0.027	3				0.255	0.678	266	1.059	0.705	67
13	පුත්තලම	0.396	0.404	102				12.791	3.278	26	13.187	3.682	28
14	අනුරාධපුරය	-	-					0.374	0.111	30	0.374	0.111	30
15	පොළොන්නරුව	0.336	-	-				0.060	0.036	60	0.396	0.036	9
16	බදුල්ල	0.444	0.266	60				1.702	0.073	4	2.146	0.339	16
17	මොණරාගල	2.364	2.693	114				0.121	1.189	983	2.485	3.882	156
18	රත්නපුර	0.324	0.001	0				0.191	0.151	79	0.515	0.152	30
19	කෑගල්ල	0.144	0.177	123				3.304	0.891	27	3.448	1.068	31
20	මඩකලපුව	5.496	0.123	2				-	-		5.496	0.123	2
21	අම්පාර	9.264	1.014	11	2.136	2.217	104	-	2.789		11.400	6.020	53
22	ත්‍රිකුණාමලය	1.068	0.120	11				-	0.304		1.068	0.424	40
23	යාපනය	0.888	0.100	11	1.056	2.870	272	0.187	0.722	386	2.131	3.692	173
24	මන්නාරම	0.324	0.036	11				-	-		0.324	0.036	11
25	වව්නියාව	1.344	3.128	233				-	-		1.344	3.128	233
26	මුලතිව්							-	-		-	-	
27	කිලිනොච්චි							-	-		-	-	
	මුළු එකතුව	39.780	9.204	23	203.628	230.766	113	158.314	85.033	54	401.722	325.003	81

ඕෂන් විව් ඩිවෙලප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්.

හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ හා නාගරික සංවර්ධන අධිකාරියේ කොටස් හිමිකාරිත්වය යටතේ බම්බලපිටිය ටවර් ගොඩනැගිල්ලේ පිහිටා ඇති ඕෂන් විව් ඩිවෙලප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කර පසුව 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුව ලියාපදිංචි අංක PV 17667 ලෙස නැවත ලියාපදිංචි කිරීම සිදුකර ඇති අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරියට එහි 56.6% ක කොටස් හිමිකාරිත්වය ඇත. 1994 ජූලි 13 වන දින ඕෂන් විව් ඩිවෙලප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ආරම්භ කරන ලදී.

දැක්ම

ශ්‍රී ලංකාවේ දේපළ සංවර්ධන වෙළඳපොළ තුළ ප්‍රමුඛතව දේපළ සංවර්ධන සමාගම බවට පත්වීම.

මෙහෙවර

ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතා මත පදනම්ව, තරඟකාරී මිල ගණන් යටතේ, අංග සම්පූර්ණ පහසුකම්වලින් සමන්විත, තනි නිවාස ඒකක මෙන්ම සහාධිපත්‍ය නිවාස දේපළ ද, දැරිය හැකි මිලකට සපයා දෙමින් දේශීය දේපළ සංවර්ධන වෙළඳපොළට සහාය වීම.

අරමුණු

- ඕෂන් ටවර් ගොඩනැගිල්ල කළමණාකරනය කිරීම.
- දේපළ සංවර්ධනය කිරීම හා විකිණීම.
- ආයතනයේ ගණුදෙනුකරුවන්ට උපරිම සේවයක් සැපයීම.
- නව රැකියා උත්පාදනය කිරීම.
- සේවක සුභ සාධනය සහ සේවක රක්ෂණය.

අධ්‍යක්ෂ මණ්ඩලය

මහින්ද සෙනෙවිරත්න මහතා	-	සභාපති / කළමණාකාර අධ්‍යක්ෂ
චායා තිළිණි මිය	-	අධ්‍යක්ෂක
ලලිත් ද සොයිසා අබේසිරිවර්ධන මහතා	-	අධ්‍යක්ෂක
අනුරාධ සෙනරත් වේරගොඩ මහතා	-	අධ්‍යක්ෂක
පිලිප් පතිරාජ මුදලිගේ දොන් සාලිය මහතා	-	අධ්‍යක්ෂක
ජේ.එච්. නිමල් කුමාර මහතා	-	අධ්‍යක්ෂක
එම්. එම්. ලලිත් ප්‍රසන්න විජයරත්න මහතා	-	අධ්‍යක්ෂක
එච්.ඩී. නිශාන්ත කැලුම් ජයසුමන මහතා	-	අධ්‍යක්ෂක
එච්.කේ. දමිත පුෂ්පකුමාර මහතා	-	අධ්‍යක්ෂක
කල්පන ගවේෂ මහතා	-	අධ්‍යක්ෂක
රනූෂා විජේසිංහ මිය	-	සමාගම් ලේකම්

කාර්ය මණ්ඩලය

2021 වර්ෂයේ දී සමාගමේ සමස්ථ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- විධායක කාර්ය මණ්ඩලය - 10
- විධායක නොවන කාර්ය මණ්ඩලය - 13
- නඩත්තු අංශයේ කාර්ය මණ්ඩලය - 28

එකතුව **51**

2021.12.31 දක්වා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය.

ආයතනික ප්‍රගතිය

විකුණුම් වාර්තාව

වර්ෂය	2015	2016	2017	2018	2019	2020	2021
ආදායම රුපියල්	131,008,479	110,793,271	109,952,131	235,888,647	125,034,888	118,171,456	130,179,636

කළමණාකාරිත්වයේ ප්‍රගති සමාලෝචනය

- කාර්ය සාධන සාධක (KPI) සම්බන්ධයෙන් ඇගයීම් ක්‍රමයක් හඳුන්වා දෙමින් ආයතනයේ පරිපාලන කටයුතු සඳහා යොදා තුලින් කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට කටයුතු කිරීම.
- සංයුක්ත සැලැස්ම (Cooperate Plan) සකස් කිරීම.
ජීවන වියදම් දීමනා	173,789,323.40	173,789,323.40	192,498,134.68	192,498,134.68
දිරි දීමනා ගෙවීම්	4,252,153.02	4,252,153.02	6,303,579.45	6,303,579.45
ප්‍රසාද දීමනා	3,990,277.20	3,990,277.20	6,350,941.56	6,350,941.56
දිරි දීමනා -ප්‍රසාද දීමනා	9,393,262.49	9,393,262.49	1,424,835.06	1,424,835.06
E P F දායකත්ව	126,604,759.41	130,549,388.41	135,237,138.00	139,014,271.00
E TF දායකත්වය	32,042,471.15	32,831,397.15	34,568,396.73	35,323,823.73
වන්දි	489,472.00	489,472.00	804,580.00	804,580.00
නිවාඩු ගෙවීම	21,225,146.95	21,225,146.95	16,194,912.55	16,194,912.55
පුහුණුව සහ ශිෂ්‍යත්ව	436,462.00	436,462.00	61,120.00	61,120.00
නිවාඩු , නිවාඩු මුදල් බවට හරවා අය කිරීම	11,330,522.62	11,330,522.62	22,935,451.70	22,935,451.70
සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම	33,618.00	33,618.00	39,737.00	39,737.00
කාර්ය මණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රමය සාමාජික ගාස	32,438,019.91	32,438,019.91	32,630,962.75	32,630,962.75
වෛද්‍ය වාර්තා ගාස්තු	42,614.50	42,614.50	-	-
පාරිතෝෂික දීමනාව	53,896,313.60	55,295,658.60	64,693,416.00	67,071,239.00
මිනින්දෝරු මණ්ඩලය සඳහා දීමනාව	661,575.00	661,575.00	577,214.60	577,214.60
සංචාර - දේශීය	38,739,973.09	40,210,671.09	34,640,694.32	36,620,773.32
ආරක්ෂක සේවා සඳහා ගෙවීම්	19,542,779.20	19,542,779.20	18,496,596.87	18,496,596.87
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	25,726,393.24	32,345,683.24	21,598,395.67	29,770,235.67
මෝටර් රථ සඳහා ඉන්ධන	22,870,738.75	22,870,738.75	23,913,883.75	23,913,883.75
යන්ත්‍රෝපකරණ සහ උපකරණ ප්‍රවාහනය සහ කුලියට	216,328.00	216,328.00	374,914.26	374,914.26
සෞඛ්‍ය සනීපාරක්ෂක සහ වෙනත් සේවා	4,083,398.00	4,083,398.00	3,770,143.61	3,770,143.61
මුද්‍රණ ගාස්තු	1,948,268.90	1,948,268.90	1,223,050.00	1,223,050.00
පුවත්පත් සහ වාර සඟරා	369,554.75	369,554.75	475,345.45	475,345.45
නිප ඇඳුම්	970,089.75	970,089.75	75,833.00	75,833.00
සේවා-තේ සැපයුම් සේවක සුබසාධනය	3,353,922.36	3,353,922.36	4,307,161.66	4,307,161.66
සුබසාධනය	1,148,085.65	1,148,085.65	2,528,488.08	2,528,488.08
නාම පුවරු	361,774.00	361,774.00	50,050.00	50,050.00
නඩත්තු - ගොඩනැගිලි සහ ව්‍යුහයන්	9,694,107.23	16,121,588.23	6,508,620.30	12,766,565.30
දේපළ පිරියත හා කාර්යාලීය උපකරණ	8,164,413.93	11,560,759.93	7,148,479.26	9,422,927.26
මෝටර් වාහන	12,426,227.34	12,426,227.34	10,340,751.46	10,340,751.46
ගෘහභාණ්ඩ	28,275.00	28,275.00	23,300.00	23,300.00
නිවාස යෝජනා ක්‍රමය	5,467,207.59	5,467,207.59	4,004,912.27	4,004,912.27
සංචාරක බංගලාව වියදම්	1,446,978.95	1,446,978.95	951,678.84	951,678.84
සභාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම	65,081,993.98	65,081,993.98	215,240,973.34	215,240,973.34
මෝටර් රථ කුලියට ගැනීම	54,336,872.57	54,336,872.57	47,517,153.44	47,517,153.44
දුරකථන	10,227,012.93	10,227,012.93	10,492,518.75	10,492,518.75
විදුලි	13,291,608.87	13,291,608.87	12,056,993.06	12,056,993.06
ජල	2,252,031.10	2,252,031.10	මෝටර් වාහන ගෘහභාණ්ඩ	2,393,659.47
කාර්යාල ගොඩනැගිලි සඳහා කුලිය	4,039,985.38	4,039,985.38	2,596,040.03	2,596,040.03
අනුපාන	9,564,664.82	9,564,664.82	8,830,382.53	8,830,382.53
වෙළඳ දැනිවිම්	5,533,532.93	5,533,532.93	2,224,547.60	2,224,547.60
නීති ගාස්තු	15,325,811.55	16,109,611.55	5,770,008.32	7,281,758.32
තැපැල් ගාස්තු	7,172,682.85	7,172,682.85	5,826,769.31	5,826,769.31
රක්ෂණ	2,386,315.06	3,989,247.06	2,591,181.14	4,207,874.14
බලපත්‍ර ගාස්තු	520,610.01	520,610.01	452,438.31	452,438.31
තොරතුරු සහ ප්‍රචාරණය	288,080.31	288,080.31	11,405.00	11,405.00
පරිපිලන වියදම්	-	3,204,276.00	-	3,748,971.00
	1,724,775,768.07	**1,800,868,818.07**	**1,953,734,046.43**	**2,032,368,826.43**

සටහන [33] මූල්‍ය වියදම්

	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	සමූහය	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	සමූහය
	2021		2020	
	රු.	රු.	රු.	රු.
බැංකු ගාස්තු	1,770,603.04	1,770,603.04	978,345.12	3,576,616.12
කුලී නිවැසියන්ට වට්ටම්	2,036,263.53	2,036,263.53	256,074.50	256,074.50
එකවර මුදල් නැවත ගෙවීමේදී ණය ගැණුම්කරු	230,891.39	230,891.39	-	-
පොලී ගෙවීම උපහාර බැංකු ණය සඳහා	298,974,397.05	298,974,397.05	423,568,587.17	423,568,587.17
පොලී ගෙවීම් වෙනත් ණය	28,202,477.22	28,202,477.22	10,290,922.81	10,290,922.81
VAT	-	-	1,961,936.36	1,961,936.36
ලාභය හා අලාභය මත වටිනාකම	-	909,082.00	-	1,229,046.00
ආදායම් බදු ගෙවිය යුතු/ (වියදම්)	-	9,445,501.00	-	8,824,914.00
ප්‍රතිනිර්මාණය (අලාභය)/නිශ්චිත ප්‍රතිලාභ වගකී	-	620,664.00	-	
	331,214,632.23	**342,189,879.23**	**437,055,865.96**	**449,708,096.96**

සටහන [34] වෙනත්වියදම්

	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	සමූහය	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	සමූහය
	2021		2020	
	රු.	රු.	රු.	රු.
විගණන ගාස්තු	2,000,000.00	2,564,000.00	2,000,000.00	2,564,000.00
මුද්දර ගාස්තු	1,633,988.31	1,633,988.31	816,018.25	816,018.25
සමීක්ෂණ වියදම්/තක්සේරු කිරීම	1,004,328.10	1,004,328.10	134,652.67	134,652.67
රඳවා ගැනීමේ බදු හා වෙනත්	-	-	597,598.39	597,598.39
ජාතිය ගොඩනැගීමේ බදු	-	-	1,565.09	1,565.09
තක්සේරු ගාස්තු	980,545.80	980,545.80	-	-
උපදේශන ගාස්තු	100,000.00	100,000.00	110,000.00	110,000.00
දිස්ත්‍රික් නිවාස කමිටුවේ වියදම්	931,041.00	931,041.00	1,640,119.39	1,640,119.39
කුලී ආපසු ගෙවීම	2,518,896.45	2,518,896.45	-	-
ප්‍රදර්ශනය සඳහා වියදම්	814,243.20	814,243.20	187,155.00	187,155.00
පොදු කාර්ය ක්‍රියාකාරකම්	2,425,649.50	2,425,649.50	1,637,895.50	1,637,895.50
අනවසර කුලී නිවැසියන් ඉවත් කිරීම	-	-	60,000.00	60,000.00
ආදර්ශ ගම්මානය සඳහා යටිතල පහසුකම්	-	-	147,461,309.20	147,461,309.20
බොල් සහ අඩමාණ ණය	672,099,269.52	675,562,094.52	567,846,505.96	577,357,473.96
කොමිස් ගෙවා - ණය එකතු කිරීම	88,890,722.11	88,890,722.11	81,467,532.85	81,467,532.85
කොමිස් ගෙවා - කුලියට එකතු කිරීම	1,920,828.62	1,920,828.62	2,496,361.37	2,496,361.37
චන්දි නිවාස	16,766,000.00	16,766,000.00	-	-
පාඩු සහ කපා හැරීම	4,794,733.11	4,794,733.11	-	-
සෙවණ ප්‍රදාන වියදම්	560,000.00	560,000.00	-	-
වෙනත් දීමනා ගෙවීම	-	-	43,580,247.48	43,580,247.48
චන්දි ලබාදීම (නීතිමය)		-	5,000.00	5,000.00
හොරණ හගල්ල වත්ත ආධාර	-	-	3,310,000.00	3,310,000.00
ආධාර වියදම්	7,070,289,667.00	7,070,289,667.00	4,281,967,450.51	4,281,967,450.51
ස්ථාවර වත්කම් ක්ෂය වීම	56,943,153.42	63,044,317.42	58,920,801.95	68,722,377.95
	7,924,673,066.14	**7,934,801,055.14**	**5,190,930,213.61**	**5,210,806,757.61**

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

රු.මිලියන

	ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	සමුච්චිත අතිරික්තයන් / අඩුපාඩු	MINORITY INTEREST OVDC
2020 ජනවාරි 01 දිනට ශේෂය	40.000	43,089.795	(16,663.444)	1,088.989
2020 සඳහා ශුද්ධ වත්කම් / කොටස්වල වෙනස්වීම		1,209.618		
කාල සීමාව සඳහා අතිරික්තය / හිඟය			(1,026.514)	
Minority Interest OVDC පෙර වසර ගැලපීම			169.812 347.611	130.209
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	40.000	44,299.413	(17,172.535)	1,218.755
2021 ජනවාරි 01 දිනට ශේෂය	40.000	44,299.413	(17,172.535)	1,218.755
2021 සඳහා ශුද්ධ වත්කම් / කොටස් වෙනස් කිරීම		753.025		
කාල පරිද් ශේෂය දෙසැම්බර් 31,2020 ට කාල සීමාව සඳහා අතිරික්තය / හිඟය (OVDC)			(841.637) 152.989	118.432
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	40.000	45,052.438	(17,861.183)	1,337.187

7. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එච්යූඩී/ඒ/එන්එච්ඩීඒ /01/2021/18
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 නොවැම්බර් 25

National Housing Development Authority
INTERNAL AUDIT BRANCH
01 DEC 2022
1929

RECEIVED
30 NOV 2022
Signature
GM'S OFFICE

සභාපති,
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

සභාපති කාර්යාලය
29 NOV 2022
ජා.නි.සං. අධිකාරිය

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් -1. ලේකම්, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

SIGN
Ot...

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එවියුඩී/ඒ/එන්එඑඩීඒ / 01/2021/18

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 නොවැම්බර් 25 දින

සභාපති,
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයෙහි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") සහ එහි පරිපාලිතයෙහි ("සමූහය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ සහ සමූහයෙහි 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි පදනමට 1987 හා 1988 වර්ෂවලදී අත්පත් කරගෙන තිබූ හන්නාන නිවාඩු නිකේතනයට අයත් පර්චස් 17.43 ක් වූ ඉඩම අත්පත් කරගෙන වසර 30 කට අධික කාලයක් ඉක්මවා තිබුණද , සමාලෝචිත වර්ෂය අවසානයටද එහි වටිනාකම රු.2,520 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 27 හා 47 ඡේද ප්‍රකාරව ඉඩමේ වටිනාකම සාධාරණ අගයට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 ප්‍රකාරව අධිකාරිය සතු කුලී පදනම මත බැහැර කිරීමට ඇති වටිනාකම රු. මිලියන 1,119.56 ක් වූ නිවාස හා කඩසාප්පු ආයෝජන වත්කම් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වුවත් එසේ සිදු නොකර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඇ) අධිකාරිය සතු නිවාස යෝජනා ක්‍රම සහිත ඉඩම්, හිස් ඉඩම්, හා අනවසරව වෙනත් පාර්ශව විසින් භාවිතා කරන හෙක්ටයාර් 473.15 ක් වූ ඉඩම් කොටස් 8,286 ක වටිනාකම සහ අධිකාරිය සතු 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 565.05 ක් වූ කාර්යාල හා කුලී පදනම මත ලබා දෙන ලද ගොඩනැගිලි පිහිටි ඉඩම් ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගෙන එම ඉඩම්වල වටිනාකම තක්සේරුකර සාධාරණ අගයට ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) 1985 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 237.92 ක් වූ මෝටර් රථ 134 ක් හා 1990 වර්ෂයේ ජපන් ආධාර යටතේ ලැබී තිබූ පිරිවැය රු.මිලියන 23.94 ක් වූ පිරියත උපකරණ 11 ක් සහ 2016 වර්ෂයට පෙර මිලදී ගත් පිරිවැය රු.මිලියන 147.87 ක් වූ උපකරණ හා පිරිවැය රු.මිලියන 52.55 ක් වූ ලී බඩු සවි කිරීම් ඇතුලු රු.මිලියන 462.28 ක් වූ වත්කම් 2021 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්ව පැවතුණි. මෙම වත්කම් අතරින් අධිකාරිය විසින් තවදුරටත් භාවිතා කරමින් පවතින වත්කම් ප්‍රත්‍යාගණනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 37 (ඉ) ඡේදය ප්‍රකාරව මෙකී වත්කම් වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දැක්වෙන ණය හිමියන් , ණය සඳහා ජංගම වගකීම් හා තැන්පතු සඳහා වූ බැර ශේෂ 32 ක එකතුව රු. මිලියන 1,995.45 කට හා දේශීය ප්‍රදාන (Domestic Grant) යටතේ දැක්වෙන රු. මිලියන 1,849.31 ක් වූ වෙනත් ප්‍රදාන සඳහා විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද එකතුව රු. මිලියන 1,118.12 ක් වූ ණයහිමි ශේෂ 09 ක් සඳහා ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර වසර 05 ඉක්මවූ එකතුව රු. මිලියන 1,495.73 ක ගෙවිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඊ) හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයට අනුබද්ධව තිබූ වීරකැටිය සහ හම්බන්තොට කලාප කාර්යාලය අතර සිදු කර තිබූ මුදල් මාරු කිරීම් ගනුදෙනු සටහන් කිරීමට පවත්වා ගෙන ගිය මුදල් මාරු කිරීම් ගිණුමේ 2019 වර්ෂයේ රු. මිලියන 14.26 ක්ව පැවති බැර ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විටද රු.මිලියන 14.04 ක් ව තිබූ අතර එය සමස්ථ මුදල් ශේෂයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. මේ හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. මෙය ගිණුම් තැබීමේ දෝෂය 2022 අප්‍රේල් 26 දින නිවැරදි කර තිබුණි.

(උ) අධිකාරිය සතු කුලියට/බද්දට ලබාදී තිබූ කඩ සාප්පු ප්‍රමාණය 1,816 ක් වූ අතර එයින් 1,786 ක් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබුණි. ඒ අතරින් 942 ක් රු.100 ට වඩා අඩු මාසික කුලී පදනම් මත ලබාදී තිබූ අතර තවත් කඩ සාප්පු 09 ක් කිසිදු බදු මුදලක් අය නොකර බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණි. තවද කඩසාප්පු 744 ක් මාසික බදු කුලිය රු.101 ත් රු.1,000 අතර මුදලකට කුලියකට ලබා දී තිබුණි. බදු කුලිය ගණනයේදී දේපලේ වටිනාකමින් සියයට 04 ක වටිනාකම හෝ ශුද්ධ ආදායම මත සියයට 4 ක් යන වටිනාකම්වලින් අඩු වටිනාකම බදු කුලිය ලෙස සැලකිය යුතු අතර සෑම වසර 02 කට වරක් බදු ගිවිසුම් අළුත් කිරීම කළ යුතු වේ. අධිකාරිය කඩ සාප්පු බදු දීමේදී බදු කුලිය එසේ නක්සේරු කර නොතිබුණු අතර කොළඹ දිස්ත්‍රික්කයේ කඩසාප්පු වලින් සියයට 89 ක් එනම් කඩසාප්පු 1,582 ක බදු ගිවිසුම් ආරම්භ කරන ලද දින සිටම යාවත්කාලීන කර නොතිබුණි. ඒ අනුව වර්තමාන නක්සේරු වටිනාකමට කුලියට/බද්දට නොදීම නිසා අධිකාරියට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි.

(ඌ) රු.මිලියන 254.89 ක් වූ වතු නිවාස කොන්ත්‍රාත් තැන්පතු ගෙවීම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.මේ හේතුවෙන් එම තැන්පතු නිරවුල් කල යුතු කාල වකවානු පිළිබඳ විගණනයේදී නිරීක්ෂණය කල නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමූහයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු *ලබා ගත හැකි වූ විට* සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය ිකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම ්න් වීමට හැකිය.

ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා යාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම් වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම්, අධීක්ෂණය හා කාර්යසාධනය සඳහා මා වග කිව යුතුය. මෙම විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වග කිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තක්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තක්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ අ, ආ ,ඇ, ඒ ලෙස දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට නරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති, විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 වන වගන්තිය	වැඩ බැලීමේ පත් කිරීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර, තනතුරට පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම් නොපමාව කළයුතු වන අතර පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නොවේනම් අනෙක් නිලධාරීන් අතර රාජකාරි බෙදාදිය යුතුවේ . එහෙත් තනතුරු 17 ක් සඳහා වැඩ බැලීම් වසර 01 සිට අවුරුදු 06 දක්වා දීර්ඝකාලීනව සිදුවන බව නිරීක්ෂණය විය.
(ආ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 (බී) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබූ එකතුව රු. මිලියන 683.5 ක කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. නිවාස අපේක්ෂිත දිළිදු පවුල් වෙත සහන සැලසීම සඳහා වූ සෙවන අරමුදලින් ලැබී තිබූ රු.මිලියන 375 ක්ද ඒ තුළ ඇතුලත් වී තිබුණි.
(ඇ)	2003 මැයි 30 දිනැති අංක 12 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛයේ 9.4 ඡේදය	ආයතනයක සේවකයන් රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතනයක් වෙත කැඳවීමට අනුමැතියකින් තොරව මූදාහැරිය නොහැකි වන අතර එසේ විධිමත් අනුමැතියක් මත මුදාහරින්නේ නම් එම කාලය තුල කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතුවේ. එහෙත් එයට පටහැනිව

		අධිකාරියේ නිලධාරීන් 07 දෙනෙක් අමාත්‍යාංශ, සංස්ථා සහ සමාගම් වෙත මුදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.මිලියන 3.6 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.
(ඉ)	2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	භාවිතයෙන් ඉවත් කළ වාහන හදුනාගෙන අපහරණ ක්‍රියාවලිය සෑම වර්ෂයකම මාර්තු 31 දිනට නිමකළ යුතු වූවද 2017 වර්ෂයේ සිට අපහරණය කළ යුතුයැයි තීරණය කර තිබූ වාහන 33 න් වාහන 06ක් 2022 ඔක්තෝබර 30 වන විටත් අපහරණය කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2016 වර්ෂයේ ආරම්භ කරන ලද හා මාස 19 සිට මාස 47 දක්වා කාල සීමාවක් තුළ නිමකිරීමට යෝජිත ඉහළ ආදායම්ලාභීන් 2,503 ක් සඳහා ක්‍රියාත්මක කරන ලද සැමට සෙවන නිවාස වැඩසටහනේ සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රගතිය සියයට 41 ක් ව පැවති අතර නිවාස ඒකක 1,463 ක වැඩ අවසන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී මිහිදු නිවාස වැඩසටහන සඳහා රු.මිලියන 750 ක වියදමින් ඒකක 2,000 ක වැඩ ආරම්භ කිරීමටත් ඒ අතරින් ඒකක 500 ක වැඩ නිම කිරීමටත් සැළසුම් කර තිබුණද, ඒකක 1242 ක වැඩ ආරම්භ කිරීමට හා ඒකක 299 ක වැඩ නිම කිරීමට නොහැකි වී තිබුණි. මේ නිසා එම වැඩසටහනේ ප්‍රගතිය සියයට 27 ක් පමණක් වී තිබුණි.

(ඇ) ආදර්ශ ගම්මාන සහ සෙවණ ආධාර යන වැඩසටහන් යටතේ වූ නිවාස ඒකක 730 ක වැඩ කටයුතු නිම කිරීමට සමාලෝචිත වර්ෂයේ දී සැලසුම් කර තිබුණ ද ආදර්ශ ගම්මාන ආධාර වැඩසටහන සම්බන්ධයෙන් කිසිදු කටයුත්තක් සිදුකර නොතිබූ අතර අවිච්ඡේද සෙවණ ආධාර වැඩසටහන යටතේ ඒක් නිවසක් පමණක් ඉදිකර තිබුණි.

(ඇ) නිවාස ආශ්‍රිත ක්‍රියාකාරකම් යටතේ පැරණි නිවාස සංකීර්ණ අළුත්වැඩියාව සහ නිවාස වන්දි ලබා දීම සඳහා රු මිලියන 110 ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ එම ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි . තවද 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ක්‍රියාත්මක කරන ලද අනෙකුත් නිවාස ණය සහ නිවාස ආධාර වැඩසටහන් 13 ක් යටතේ ඉදිකිරීමට වැඩ ආරම්භ කළ නිවාස ඒකක 150,770 අතුරින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිවාස ඒකක 55,225 ක් හෙවත් සියයට 37 ක් පමණක් නිමකර තිබූ අතර වැඩ ආරම්භ කළ නිවාස ඒකක 4,987 ක වැඩ අතරමඟ නවතා තිබුණි.

(ඉ) 2016 ඔක්තෝබර් 14 දිනැති අංක 16/2040/701/032 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂය තුළ එනම් එක් ගම්මානයකට නිවාස 25 බැගින් නිවාස 12,500 කින් සමන්විත ව්‍යාපෘති 500 ක් රු. මිලියන 6,250 කට ඉදිකර අවසන් කිරීමට තීරණය කර තිබුණි. වසර 04 ක් ගතවුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකර අවසන් කර තිබූ ආදර්ශ ගම්මාන සංඛ්‍යාව 368 ක් වූ අතර ඒ යටතේ ඉදිකළ මුළු නිවාස ඒකක ගණන 10,159 ක් වී තිබුණි. ඒ වෙනුවෙන් රු.මිලියන 4,798 ක් වැයකර තිබුණි. තවද මෙම ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ ඉදිකරමින් පැවති නිවාස ඒකක 2,499 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 163.90 ක් ප්‍රතිපාදනය කරගෙන තිබුණත් දිස්ත්‍රික්ක 07 කට වෙන්කර තිබූ රු.මිලියන 84.3 කින් වැයකර තිබූ මුදල රු.මිලියන 47 ක් පමණක් වී තිබුණි.

(උ) ඉහත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකර තිබූ නිවාස 186 ක් සම්බන්ධව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් තෝරා ගැනීමට විධිමත් ක්‍රමවේදයකින් තොරව ඉඩම් හිමිව තිබූ පුද්ගලයන් 66 දෙනෙකුට එනම් සියයට 35 කට ඉඩම් ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. තවද ණය මුදල් නිසි පරිදි අදියර මට්ටමින් ලබා නොදීම හේතුවෙන් 2018/2019 වර්ෂයේ ආරම්භකර මාස 06 කින් නිමකල යුතුව තිබූ නිවාස 176 කට එනම් සියයට 26 ක් 2021 වර්ෂයේ ආරම්භයේ අවිවශ්‍යේද නිවාස ලෙස පැවති අතර කිසිදු නිවසකට අවශ්‍ය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී ලබා නොදීම හේතුවෙන් එම නිවාස නිමකර පදිංචිවීමට නොහැකිව පැවතුනු අතර ඉන් නිවාස 36 ක් සම්පූර්ණයෙන්ම වල් බිහිවී තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ලාභාංශ ,ගාස්තු ආදායම්, සෙවන මාධ්‍ය ඒකකයේ ආදායම ඇතුළු ආදායම් විෂයයන් 06ක ඇස්තමේන්තුගත ආදයමට වඩා නත්‍ය ආදායම සියයට 61 සිට 1,337 දක්වා රු. මිලියන 676.6 ක් වැඩියෙන් උපයාගෙන තිබූ අතර ආදායම් විෂයයන් 06 ක ආදායම සියයට 12 සිට සියයට 52 දක්වා ඇස්තමේන්තුගත ආදායම ලගාකර ගැනීමට නොහැකිවී තිබුණි. තවද විෂයයන් 11 කට අදාලව ඇස්තමේන්තුකල රු. මිලියන 141.25 ක් වූ ආදායමෙන් සමාලෝචිත වර්ෂය තුල කිසිදු ආදායමක් ලබාගෙන නොතිබූ අතර ඇස්තමේන්තු නොකරන ලද ආදායම් විෂයයන් 07 කින් රු. මිලියන 7,310 ක ආදායමක් ලබාගෙන තිබුණි. ඒ අනුව ආදායම්

ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී යථාර්තවාදී නොරතුරු පදනම් කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(එ) අයවැය ලේඛනය හා සත්‍ය වියදම සැසඳීමේදී, වෙනත් දීමනා සඳහා සත්‍ය වියදමට වඩා සියයට 432 ක් වැඩියෙන් එනම් රු.මිලියන 25.8 ක් ඇස්තමේන්තු කර තිබීම, වියදම් විෂයන් 08 ක් සඳහා ඇස්තමේන්තු කර තිබූ එකතුව රු. මිලියන 5.19 ක වියදම් සියයට 100 ක් ම ඉතිරිවී තිබීම සහ තවද ඇස්තමේන්තු නොකරන ලද වියදම් විෂයයන් 13 ක් සඳහා රු. මිලියන 7,167.82 ක් වැයකර තිබීමත් නිසා අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඒ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 ක ප්‍රතිලාභීන් 8817 දෙනෙකුගෙන් 2021 සැප්තැම්බර් 30 දිනට අයවිය යුතු මුදල රු.මිලියන 236.15 ක් වූ අතර එයින් 1461 දෙනෙකුගෙන් අයවිය යුතු ව තිබූ රු. මිලියන 82.04 ක් 2021 සැප්තැම්බර් 30 දිනට අවුරුදු 03 ඉක්මවා හිඟ හිටව තිබුණි. තවද රු. මිලියන 115.26 ක් අවුරුදු 1-3 ත් අතර කාලයක් තුළ ප්‍රතිලාභීන් 3828 දෙනෙකුගෙන් අයවිය යුතු වුවද එම මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. නියැදි පරීක්ෂණයකදී හෙලිදරව් කරගත් පරිදි මහනුවර වතු නිවාස ණය ලේඛනයට අනුව 2021 සැප්තැම්බර් 03 දිනට ප්‍රතිලාභීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව මාසික ණය අයකිරීම් වාර්තාවට අනුව අයවිය යුතු ණය මුදලට වඩා රු. මිලියන 1.045 ක් වැඩියෙන් දක්වා තිබූ අතර අවස්ථා 12 කදී අය විය යුතු ණය ශේෂ එකතුව රු. මිලියන 1.57 අඩුවෙන් දක්වා තිබීමෙන් ණය අයවීම් නිවැරදිව හා යාවත්කාලීනව සටහන් නොවන බව නිරීක්ෂණය විය.

(ඔ) රුපියල් ලක්ෂ 06 බැගින් නිවාස ණයලාභීන් 720 කට ලබා දුන් රු. මිලියන 4,320 ක නිවාස ණය වලින් ඉදිකර තිබූ ආදර්ශ ගම්මාන 288 ක නිවාස ජනතා අයිතියට පවරාදීමේ උත්සව සම්බන්ධයෙන් වූ පුවත්පත් දැන්වීම් පළකිරීමට 2015-2019 කාල පරිච්ඡේදය තුල සෙවන මාධ්‍යය ඒකකය විසින් රු.මිලියන 307.7 ක් වැයකර තිබුණි.

(ඕ) අධිකාරිය සතු විකිණීමට හෝ කුලියට /බදු දීමට ඇති නිවාස හා කඩසාප්පු ඒකක 117 කින් නිවාස හා කඩ සාප්පු 34 ක් අනවසර පදිංචිවීම, භාවිතයට නුසුදුසු තත්ත්වයේ තිබීම, වැනි හේතු මත විකිණීමට හෝ කුලියට /බද්දට දීමට නොහැකි තත්ත්වයේ පැවති අතර විගණිත දින වූ 2022 මැයි 25 දින වන විටත් ඒවා නිරවුල් කර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

(ක) සෙවන මාධ්‍යය ඒකකයට 2011 සිට 2020 දක්වා කාලය තුළ ප්‍රචාරක දැන්වීම් වෙනුවෙන් රාජ්‍ය සංස්ථා 22 ක් ඇතුළු රාජ්‍ය ආයතන 27 කින් හා සමාගම් 03 කින් අයවිය යුතු එකතුව රු.මිලියන 15.97 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නොහැකි වී නොතිබුණි.

(ග) ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශය, දේපල අංශය සහ දිස්ත්‍රික් කාර්යාල මගින් නිවාස හා දේපල පිළිබඳ වෙන වෙනම දත්තයන් පවත්වා ගෙන ගියද විකිණීමට/කුලියට දීමට/බදු දීමට ඇති නිවාස

හා කඩසාප්පුවල ඒකක ප්‍රමාණය හඳුනා ගැනීමට හැකිවන පරිදි සකස් කල මධ්‍යගත ලේඛනයක් අධිකාරිය විසින් නඩත්තු කර නොතිබුණි.

(ච) 2015-2019 කාලපරිච්ඡේදය තුළ මුද්‍රණය කර තිබූ රු. මිලියන 2.12 ක් වටිනා විස්තර පත්‍රිකා සහ නිවාස ප්‍රදාන පත්‍ර 18 කට අදාල ලිපිගොනු කවර හා පෝස්ටර් තොග නිශ්කාර්යව ගබඩා කර තිබූ අතර වසර ගණනාවක් භාවිතයට නොගැනීම නිසා ප්‍රයෝජනයට ගතනොහැකි තත්ත්වයට පත්වී තිබුණි තවද ගබඩා ඉඩකඩ අනවශ්‍ය ලෙස ඇහිරී තිබූ අතර ගබඩා පාලනය දුර්වල මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය.

(ජ) අධිකාරිය සතු කොළඹ 10 ඩාර්ලි පාරේ පිහිටි අක්කර 01 යි පර්චස් 26.5 ක ඉඩමේ නිවාස සහ වෙළඳ සංකීර්ණයක් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා ප්‍රසිද්ධ මිල කැඳවීමකින් තොරව 2005 නොවැම්බර් 09 දිනැති කැබිනට් අනුමැතිය මත BAY SAT MBH (Pvt) LTD විදේශ සමාගමට ලබාදී තිබුණි. එම සමාගම සමග 2006 ජූනි 23 දින එලඹී ගිවිසුම් ප්‍රකාරව ඉඩමේ වටිනාකම රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ රු. මිලියන 650 ක තක්සේරුව මත අයකිරීමටත් , වසර 06 ක් තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු රු.මිලියන 162 ක ලාභාංශයක් අධිකාරියට ලබාදීමටත් එකගවී තිබුණි. නමුත් BAY SAT MBH (Pvt) LTD සමාගම යෝජිත සංවර්ධන කාර්යයන් ඉටු නොකර 2006 වර්ෂයේදීම ඉන් ඉවත්වී තිබූ අතර එම කාර්යය සඳහා L & T Infrastructure Development සමාගම හඳුන්වා දී තිබුණි මෙම නව සමාගම සමග අධිකාරිය 2016 දී ගිවිසුම් ගතවීමේදී ඉඩම් සඳහා නව තක්සේරු වාර්තාවක් ලබා නොගෙන වසර 10 කට පෙර 2006 වර්ෂයේදී ලබාගන්නා ලද තක්සේරු වටිනාකමට පවරා දී තිබුණි. 2016 මැයි 05 දින ගිවිසුම් යටතේ මුදල් ගෙවීමට පෙර අංක 983 දරන ඔප්පුව මඟින් 2016 මැයි 05 දිනදීම මෙම ඉඩමේ අයිතිය සමාගමට පවරා දී තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව රු.මිලියන 712 විදේශීය මුදලින් ගෙවිය යුතු විය. එහෙත් එයට පටහැනිව ඉඩමේ කැබලි අංක 2,3,4 යන බිම් කොටස් 3 සම්පත් බැංකුවට උගස්කර ලබාගන්නා ලද රු.මිලියන 800 ක මුදලින් 2016 මැයි 05 දිනැති සම්පත් බැංකු චෙක්පත් දෙකක් මගින් මෙම ගෙවීම් කර තිබුණි.

එසේ වුවද 2017 ඔක්තෝබර් 31 දින දක්වාම L & T Infrastructure Development සමාගම විසින් යෝජිත සංවර්ධන කාර්යයන් ඉටුකර නොතිබුණි.මේ අතර සමාගම විසින් OAK නැමැති සමාගම වෙත මෙම ඉඩමේ කැබලි අංක 05 කොටස ඔප්පුවක් මඟින් විකුණා තිබූ අතර OAK සමාගම එම ඔප්පුව මහජන බැංකුවේ උකස්කර රු.මිලියන 950 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. අධිකාරිය විසින් විකුණුම්කර ඔප්පුව අවලංගු කර තිබූ නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දුවක් ලබාදෙන තෙක් ඉඩමේ භුක්තිය OAK සමාගම වෙත ලබාදී තිබුණි.

(ට) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු නාවල පරංගියා කුඹුර නැමති අක්කර 05 පර්චස් 10 ක ඉඩම කැබිනට් තීරණයකට අනුව 2004 වර්ෂයේදී වසර 03 ක් ඇතුළත නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණු අතර එම ඉඩමේ රජයේ තක්සේරු වටිනාකම වූ රු.මිලියන 75 කට Eco Home Lanka Ltd සමාගම වෙත කොන්දේසි සහිත සින්නක්කර ඔප්පුවක් මගින් පවරාදී තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති කාර්යයන් ඉටු නොකිරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. තවද එම ඉඩම පැවරීමේදී 2004 වර්ෂයේ තක්සේරු වටිනාකම වූ රු.මිලියන 121.5 ක් වෙනුවට 2003 වර්ෂයේ තක්සේරු වටිනාකම වූ රු.මිලියන 75 කට පැවරීමට තීරණය කර තිබූ අතර එය 2004 තක්සේරු වටිනාකමට වඩා රු. මිලියන 46.5 ක් අඩුවී තිබුණි. කෙසේ වුවද, සමාගම විසින් ගිවිසුම්ගත පරිදි සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු වෙනුවට පවරා දෙන ලද ඉඩමෙන් පර්චස් 29.44 ක් රු.මිලියන 196.5 කට සෙලින්කෝ හොස්පිටල්ස් සර්විස් සමාගමට 2006 වර්ෂයේදී විකුණා තිබුණි. ඒ අතර ඉතිරි ඉඩම සෙලාන් බැංකුවට උගස් කර රු.මිලියන 697.5 ක් ද ලබාගෙන තිබුණි. 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනතේ 8 (1) වගන්තිය යටතේ 2020 ජූනි 26 දින අධිකාරිය විසින් ඔප්පුව අවලංගු කර තිබූ අතර සමාගම ඊට එරෙහිව නඩු පවරා තිබුණි.

- 2020 දක්වා නිවාස සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු ඉටු නොකිරීම හේතුවෙන් අධිකාරියට සිදුවූ පාඩුව රු.මිලියන 4.5 ක් බවට අධිකාරිය විසින් ගණනය කර තිබුණි.

- තවද, 2020 සැප්තැම්බර් 01 දිනැති අංක 15/2020 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් මෙම ඉඩම ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් හා ගිවිසුමකින් තොරව පෞද්ගලික සමාගමකට රු.100,000 ක මාසික කුලියකට ජලසම්පාදන උපකරණ ගබඩාවක් පවත්වා ගෙන යාම සඳහා ලබා දී තිබුණි. 2022 ඔක්තෝබර් 01 දින සිට එහි මාසික කුලිය රු.500,000 දක්වා වැඩිකර කාලය 2023 ජනවාරි 31 දක්වා දීර්ඝකර තිබූ අතර ඉදිකිරීම් ද්‍රව්‍ය ගොඩගැසීම සිදුකර තිබුණි. තවද විශාල කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් , බැකෝ යන්ත්‍රයක්, සහ ජෙනරේටරයක් ඉඩමේ විනාශවීමට ඉඩහැර තිබූ අතර දින 14 ක් තුළ ඉවත් කර ගන්නා ලෙස 2021 මැයි 31 දිනැති ලිපියෙන් සාමාන්‍යාධිකාරී විසින් එකෝ හෝම් සමාගම වෙත දැනුම් දී තිබුණද එම උපකරණ මෙම වාර්තාවේ දිනය දක්වාම ඉවත් කර ගෙන නොතිබුණි.

ඉහත (ජ) හි සහ (ට) හි සඳහන් කරුනු අනුව අධිකාරිය විසින් ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීමේදී නිසි පරිදි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය නොකිරීම, අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර නිවැරදිව ගිවිසුම් සකස් නොකිරීම, නියමිත තක්සේරු වටිනාකම් ලබා නොගැනීම හා නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු නොකිරීම යන කරුණු හේතුවෙන් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වීම නිසා අධිකාරියේ අරමුණු මහජන යහපත සැලසෙන අයුරින් ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඩ) මු.රෙ.135(4) අනුව බලතල පැවරීම යම් නිශ්චිත කාලයකට වරක් ප්‍රතිශෝධනය කළ යුතු වුවත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ කරන ලද නියැදි පරීක්ෂාවකදී හෙලිදරව් වූ පරිදි අධිකාරිය විසින් 2019 වර්ෂයේ මූල්‍ය බලතල පැවරීම සිදුකර තිබුණේ 2016 බලතල පැවරීමේ වාර්තාවට අනුවය. ඒ අනුව එහි බලතල සීමාවන් යටතේ අංක 2 (ඇ) අනුව ප්‍රධාන කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) ජ්‍යෙෂ්ඨ ගණකාධිවරයෙකුට ගිණුම් අතර මුදල් හුවමාරු කිරීමේ ලිපි අත්සන් කිරීමේ සීමාව රු.මිලියන 05 ක් වුවද සීමාව ඉක්මවා අවස්ථා 58 කදී එකතුව රු.මිලියන 1,522.81 ක මාරුකිරීම් සඳහා අත්සන් කර තිබුණි. තවද දිස්ත්‍රික් කාර්යාල වල සහ කලාප කාර්යාලවල ගිණුම් අතර මුදල් මාරු කිරීමේ ලිපි අත්සන් කිරීමේ සීමාව රු.මිලියන 02 ක් වුවද අවස්ථා 111 කදී එම සීමාව ඉක්මවා එකතුව රු. මිලියන 2,013.11 ක් හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයෙන් මාරු කර තිබුණි.

(ත) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII හි 13.3 හා 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක I හා II ඡේදය පරිදි මූලික විමර්ශණයක් මාස 02 කින්ද චෝදනා පත්‍රයක් සහිත විනය පරීක්ෂණයක් මාස 06 කින්ද අවසන් කළ යුතු නමුත් අධිකාරියේ වැඩ තහනම් කළ නිලධාරීන් 07 දෙනෙකුට අදාල චෝදනාපත්‍ර නිකුත් කිරීමට මාස 05 සිට මාස 15 දක්වා කාලයක් ගතකර තිබූ අතර චෝදනා 15 ක් සම්බන්ධයෙන් විනය පරීක්ෂණ ආරම්භ කර අවසාන කිරීමට මාස 09 ත් මාස 27 ත් අතර කාලයක් ගතකර තිබුණි. තවද අධිකාරිය විසින් අවසන් කර තිබූ විනය පරීක්ෂණ 13 ක් සම්බන්ධයෙන් නියෝග නිකුත් කිරීමට විනය පරීක්ෂණය අවසන් වූ දින සිට මාස 11 ත් මාස 74 ත් අතර කාල පරාසයන් ගතකර තිබුණි.

(ද) හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ 2015-2019 දක්වා සිදුකර තිබූ අක්‍රමිකතා සම්බන්ධයෙන් 2020 පෙබරවාරි 20 දින පැවති 03/2020 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ නිර්දේශ පරිදි 2020 පෙබරවාරි 21 දින සිට වැඩ තහනම් කර තිබූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් නිලධාරීන් 04 දෙනෙකුට පමණක් 2021 මාර්තු 09 දින සිට චෝදනා පත්‍ර නිකුත් කර තිබූ නමුත් ඒ සම්බන්ධ 2022 ජූලි වන විටත් විනය පරීක්ෂණ පවත්වා නොතිබුණි. තවද වීරකැටිය කලාප කාර්යාලයේ 2017-2019 අතර කාලය තුළ නිලධාරීන් 03 ක් විසින් සිදුකර තිබූ අක්‍රමිකතා සම්බන්ධයෙන් වසර 02 කට වැඩි කාලයකට පසු එනම් 2021 නොවැම්බර් 30 දිනට පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණය පරිදි වැඩ තහනම් කර තිබූ අතර 2022 ජූලි වන විටත් චෝදනාපත්‍ර නිකුත් කර නොතිබුණි. තවද 2021 ජූලි 05 දින චෝදනාපත්‍ර බාරදී තිබූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දේපල කළමනාකරණ) අනිවාර්ය නිවාඩු යවා වසරකට වැඩි කාලයක් ගතවීමෙන් පසු විනය පරීක්ෂණයක් පවත්වා තිබූ නමුත් 2022 නොවැම්බර් 02 දින වන විටත් විනය නියෝග නිකුත් කර නොතිබුණි.

(න) 2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 2,164 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 2,161 ක් විය. එසේ වුවද එක් එක් තනතුරු විශ්ලේෂණයේදී පුරප්පාඩු 670 ක් හා අතිරික්තතා 232 ක් පැවතුණි.

(ප) නිවාස සංකීර්ණ අළුත්වැඩියා කිරීම සඳහා කොන්ත්‍රාත් 73 ක් වෙනුවෙන් ලබාදී තිබූ රු. මිලියන 514.14 ක අත්තිකාරම් අවු.1 සිට අවු.5 දක්වා කාලයක් ගතව තිබුණද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(බ) වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර තිබූ ණය ශේෂ වලින් වසර 15 කට වැඩි කාලයක් ගතවී ඇතත් අයකර ගෙන නොතිබූ ණය එකතුව රු.මිලියන 1,476.8 ක් වූ අතර වසර 5 ඉක්මවූ රු.මිලියන 1058 ක ලැබිය යුතු ණය ශේෂ එකතු කර ගැනීමට අධිකාරියට සමාලෝචින වර්ෂය අවසන් වන විටත් හැකි වී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති



ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කරගෙනයාම සඳහා ස්ථාපිත කර ඇති මෙම අදිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ උප කාර්යාල 09 ක් මගින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලබයි.

ශ්‍රී ලාංකීය ජනතාවගේ විශේෂයෙන්ම නිවසක් සතුකර ගැනීමට මාර්ගයක් නොමැති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ජාතික වශයෙන් උනන්දු කරවීම, පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම මෙන්ම නිවසක් නොමැති මධ්‍යම පාන්තික පවුල් සඳහා සහන මිලට නිවසක් ඉදිකර ලබාදීම සඳහා අවශ්‍ය මැදිහත්වීම. එමගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම හා ආර්ථික සමෘද්ධිය ළඟාකරදීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරයි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02
දුරකථන : 0112 232 7500
විද්‍යුත් තැපෑල : planning.nhda@gmail.com
වෙබ් : www.nhd.lk

PRINTEC | 0112 815 816